



වාර්ෂික වාර්තාව

2020

ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

පටුන

1. ප්‍රගති වාර්තාව
2. විගණකාධිපති වාර්තාව
3. විගණකාධිපති වාර්තාවට අදාළ පැහැදිලි කිරීම් වාර්තාව
4. මූල්‍ය වාර්තා

ප්‍රගති වාර්තාව - 2020

1.0 හැඳින්වීම

1985 අංක 29 දරණ පාර්ලිමේන්තු පනත ප්‍රකාරව 1986 දී පිහිටුවන ලද ජාතික අධ්‍යාපන ආයතනයට, ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන වර්ධනයට අදාළ සැලසුම්, වැඩ සටහන් සැකසුම, පිළිබඳ සහ වෙනත් ක්‍රියාකාරකම් පිළිබඳ අධ්‍යාපන ඇමතිට උපදෙස් දීමේ වගකීම පැවරී ඇත.

මෙසේ ජාතික අධ්‍යාපන ආයතනය, අධ්‍යාපනයේ වර්ධනය උදෙසා, ප්‍රතිපත්ති පහසු කරවන, මඟපෙන්වීමට හැකි, පර්යේෂණ කාර්යය කිරීම උදෙසා, විද්‍යාත්මක තොරතුරු පදනමක් තහවුරු කෙරෙන, පාසල් පද්ධතියට අවශ්‍ය දක්ෂ වෘත්තීකයන් වර්ධනයට අවශ්‍ය නායකත්වය සැපයීමට හැකි, දේශීය සහ ගෝලීය අවශ්‍යතාවනට මුහුණ දිය හැකි, ඵලදායී පුරවැසියන් වර්ධනය සැලසුම් කෙරෙන සමාජ ආර්ථික සන්දර්භයකට උචිත විෂයමාලාවක් මඟින් ගුණාත්මක අධ්‍යාපනයක් තහවුරු කිරීමේ වගකීම දරයි.

ආයතනය එම කාර්යභාරය සකස් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමෙහිදී, පනතේ දක්වන ලද අරමුණු අට (8) මූලික පදනම ලෙස සලකා ඇත.

(අ) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සංවර්ධනයට අදාළ සැලසුම්, වැඩ සටහන්, ක්‍රියාකාරකම් පිළිබඳ අධ්‍යාපන ඇමති දැනුවත් කිරීම.

(ආ) අධ්‍යාපනයේ විශේෂිත අංග සම්බන්ධයෙන් - පශ්චාත් උපාධි අධ්‍යාපනය සැපයීම වර්ධනය කිරීම.

(ඇ) අධ්‍යාපනයේ - ඉලක්ක, ව්‍යුහ, අන්තර්ගත අධ්‍යාපන ක්‍රම ඇතුළුව අධ්‍යාපනයෙහි සාධන කාර්යයද, අධ්‍යාපනයට අදාළ සමාජීය, ආර්ථික සහ වෙනත් අංග ද ඇතුළුව - ඒ පිළිබඳ, අධ්‍යයනයන් ක්‍රියාත්මක කිරීම සහ වැඩිදියුණු කිරීම.

(ඈ) අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා, තාක්ෂණය අනුවර්තනය කර ගැනීම ඇතුළුව, අධ්‍යාපන පද්ධතියෙහි නව්‍ය පුරුදු පුහුණු ආරම්භ කිරීම සහ අනුබල දීම.

(ඉ) අධ්‍යාපන පද්ධතියේ, නියුක්ත, පුද්ගලයන්ගේ, වෘත්තීමය සහ කළමනාකරණ කාර්යක්ෂමතාවට ඉඩසැලසීම සහ වර්ධනය කිරීම.

(ඊ) රජය සහ වෙනත් පිළිගත් ආයතනයන්ට, විශේෂඥ අධ්‍යාපන සේවා ලබාදීමට කටයුතු කිරීම.

(උ) ඇමති විසින් අනුමත කරන ලද අධ්‍යාපන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ඌ) සමාන අරමුණු ඇති ආයතන සමඟ සහ සම්බන්ධතා පැවත්වීම.

ලංකාවේ - විෂයමාලා ප්‍රතිපත්තිය අනුව, වසර අටකට වරක්, විෂයමාලා ප්‍රතිසංස්කරණයක්, යලි සැකසීමක් සිදු කෙරේ. ඒ අනුව ඊළඟ ප්‍රතිසංස්කරණය ක්‍රියාත්මක කෙරෙනුයේ වර්ෂ 2023 දීය.

එම නිසා මේ අවස්ථාවේ, 21 වන ශතවර්ෂයටත්, සිව්වැනි කාර්මික විප්ලවයටත් ගැලපෙන අන්දමට සම්පූර්ණ විෂයමාලාව, උග්‍ර ලෙස ප්‍රතිසංස්කරණයකට ලක්කිරීම, පර්යේෂණ මඟින් විෂයමාලා සංවර්ධනය මෙහෙයවීම, මහපෙන්වීම, ජාතික අධ්‍යාපන ආයතනයට ලබා ඇති නියත නියෝගය මත පාදක වී ඇත.

තවද, 13 වසරක පාසල් අධ්‍යාපනය අවසන්කළ සිසුවකු තුළ තිබිය යුතු ගුණාංග පහත සඳහන් සාමාන්‍ය අධ්‍යාපනයේ ජාතික අභිමතාර්ථ ලෙස, ජාතික අධ්‍යාපන ආයතනය හඳුනාගෙන ඇත. එනම්, ජාතික සංවර්ධනයට ක්‍රියාකාරී ලෙස දායක වීම, ඵලදායී සහ කාර්යක්ෂම සේවා දායකයකු වීම, හෝ ස්වයං රැකියාවක නියුක්ත වීම, ව්‍යවසායක මනසක් ඇත්තෙකු වීම, ජාතිහිතෛෂියකු වීම, යහපත් පුද්ගලයකු වීම සහ ප්‍රීතිමත් පවුලක සාමාජිකයකු වීමයි.

1.1 මුදල් සපයා ගැනීම

අධ්‍යාපන සංවර්ධන ආංශික සැලැස්ම හඳුන්වාදීමෙන් අනතුරුව, ලෝක බැංකුව, ආසියා සංවර්ධන බැංකුව, එක්සත් ජාතීන්ගේ අරමුදල ආදියෙන් සැපයුණු මුදල් ආරම්භයේදී ආවරණය කරන ලද්දේ, විෂයමාලා සංවර්ධනයට අදාළ සහ සම්බන්ධ කාර්යයන්ට අදාළ ප්‍රතිපාදන මඟිනි. ඊට අමතරව, වෘත්තීය සංවර්ධන පාඨමාලා පැවැත්වීම, වැටුප් සහ වේතන ගෙවීම්, එදිනෙදා නඩත්තු කටයුතු සහ උපයෝගිතා බිල්පත්, රජයේ ප්‍රදානයෙන් සහ ජාතික අධ්‍යාපන ආයතනය මඟින් උපයන ලද ආදායමෙන් (ගෙවීම්) කරන ලදී. නව ගොඩනැගිලි සෑදීම, පවතින ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම සහ සංවර්ධනය කිරීම, යන්ත්‍රෝපකරණ, පරිපත අත්කරගැනිම, ලීබඩු සහ කන්තෝරු උපකරණ ආදියට මූල්‍ය වියදම, රජයේ ප්‍රතිපාදන සහ ජාතික අධ්‍යාපන ආයතනය මඟින් උපයාගත් ආදායමෙන් (මූල්‍ය අවශ්‍යතා) සපයා ගන්නා ලදි.

පහත සඳහන් වගුවෙන්, 2020 වර්ෂය සඳහා ආයතනයේ වියදම් සහ ප්‍රතිපාදන පිළිබඳ තොරතුරු ලබා දී ඇත.

අරමුදල් ප්‍රභව	පුනරාවර්තන වියදම් (රුපි)		ප්‍රාග්ධන වියදම් (රුපි)	
	සංස්කරණය කරන ලද වෙන් කිරීම්	තත්‍ය වියදම	සැකසුම් වෙන් කිරීම්	තත්‍ය වියදම
රජයේ ප්‍රදාන	525,000,000.00	494,000,000.00	115,000,000.00	115,000,000.00
GEMP	220,151,000.00	111,000,000.00	23,500,000.00	18,933,292.00
ජාතික අධ්‍යාපන ආයතනයේ ආදායම	217,527,500.00	145,745,822.00	337,500,000.00	143,865,770.00
UNICEF	1,476,000.00	2,910,835.00		
UNESCO (KNLU/APEIU)	9,311,000.00	3,874,609.00		

1.2 කාර්ය මණ්ඩලය සැපයීම

පෙර සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම් වස්, ජාතික අධ්‍යාපන ආයතනයේ 450ට වැඩි සංඛ්‍යාවක කාර්ය මණ්ඩලය, විෂයානුකූලව අංශ පහකටත්, තවත් එක් අංශයකටත් අයිතිවන සේ සංවිධානය කොට, මෙහෙයවීමට ලක්කරයි. දැනට පවතින කාර්ය මණඩල තත්ත්වය, පහත වගුවෙන් පෙන්නුම් කෙරේ. නව අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් සහ මහපෙන්වීම් යටතේ ජාතික අධ්‍යාපන ආයතනයේ කළමනාකාරීත්වය, 2021 ජූනි අගවන විට, සියළුම පුරප්පාඩු සපුරාලීමේ මූලික පියවර ගෙන ඇත.


2020 අගවනවිට ආයතනයේ කාර්ය මණ්ඩලය පිළිබඳ පැහැදිලි අදහසක් පහත ඇති වගුවෙන් පෙන්නුම් කෙරේ.

තනතුරු නාමය	අනුමත සේවක සංඛ්‍යාව 2020.01.01	දැනට ඇති සේවක සංඛ්‍යාව			පුරප්පාඩු 2020.08.31
		පිරිමි	ගැහැණු	මුළු	
අධ්‍යක්ෂ ජනරාල්	01	01	-	01	-
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	01	0	0	0	01
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	06	01	0	01	05
අධ්‍යක්ෂ	27	10	08	18	09
මණ්ඩල ලේකම් (අධ්‍යාපන)	01	0	0	0	01
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ	72	29	37	66	06
කථිකාචාර්ය/ අධ්‍යාපනඥ	75	05	05	10	65
සහකාර කථිකාචාර්ය/ සහකාර අධ්‍යාපනඥ	90	35	45	80	10
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	379	134	168	302	77
මුළු	652	215	263	478	174

වර්ෂ 2020 දී, කාර්ය මණ්ඩල අඩුපාඩු සපුරාලීමට කිහිපවරක්ම වෑයම් කළද, කථිකාචාර්ය තනතුරු 65ක් ඇතුළුව අධ්‍යයන මණ්ඩල පුරප්පාඩු 97ක් තවම පවතී.

වර්ෂ 2020 අවසානය වනවිට අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සුදුසුකම් තත්වය පහත දැක්වෙන රූපයෙන් පිළිබිඹු කෙරේ.

සුදුසුකම් අනුව වර්ගීකරණය



2.0 ජාතික අධ්‍යාපන ආයතනයේ සංවිධානාත්මක ව්‍යුහය.

ආයතන සංවිධානාත්මක ව්‍යුහ මුදුනෙහි කවුන්සිලයද, අධ්‍යයන කාර්ය මණ්ඩලයද, අධ්‍යක්ෂ ජනරාල් ද වේ.

2.1 කවුන්සිලය - 2020

කවුන්සිලය ආයතනය පාලනයෙහි ඉහළම තැන දරයි. වර්ෂ 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනතෙහි සයවැනි කොටසේ ප්‍රතිපාදන අනුව, ආයතනයේ කටයුතු පාලනයත්, කළමනාකරණයත්, ක්‍රියාකාරීත්වය තීන්දු කිරීමත්, කවුන්සිලයට පැවරී ඇත. එම පනතෙහි 7 වන කොටසින් කවුන්සිලයේ සාමාජිකයන් දක්වා ඇත.

පහත සඳහන් අය 2020 වර්ෂයේදී කවුන්සිලයේ සාමාජිකයින් ලෙස කටයුතු කොට ඇත.

එන්.එච්.එම්. චිත්‍රානන්ද මහතා (ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශ)	- සභාපති (2020 අගෝස්තු 26)
මහාචාර්ය කපිල පෙරේරා මහතා (ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශ)	- සභාපති (2020 අගෝස්තු 27 සිට)
ආචාර්ය ටී.ඒ.ආර්.ජේ. ගුණසේකර මහත්මිය (අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය)	- සාමාජික (2020 මාර්තු 16 දක්වා)
ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා (අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය)	- සාමාජික (2020 මාර්තු 19 සිට)
ආචාර්ය උපාලි සේදර මහතා (රාජ්‍ය ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය)	- සාමාජික (2020 පෙබරවාරි 10 සිට)
මහාචාර්ය නාරද වර්ණසූරිය මහතා (හිටපු උපකුලපති - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ)	- සාමාජික

ආචාර්ය බී. විජයරත්න මහතා - සාමාජික
(හිටපු ලේකම් - කෘෂිකර්මාන්ත අමාත්‍යාංශය) (2020 පෙබරවාරි 10 සිට නොවැම්බර් 20)

මහාචාර්ය එම්.එස්.එම්. අනෙස් මයා - සාමාජික
(විශ්‍රාමික මහාචාර්ය දර්ශන දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

මහාචාර්ය එච්. අබේගුණවර්ධන මහතා - සාමාජික
(සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන)

ආචාර්ය අයි.එල්. ගිනිගේ මහත්මිය - සාමාජික
(හිටපු සහකාර අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය) (2020 ජූලි 15)

අනුර දිසානායක මහතා - සාමාජික
(අතිරේක ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය) (2020 ජූලි 30)

ටී.බී.එම්. අතපත්තු මහතා - සාමාජික
(සහකාර ලේකම්, (පාලන සහ මුදල්), උසස් අධ්‍යාපන අමාත්‍යාංශය) (2020 ඔක්තෝබර් 7 සිට)

අජිතා බටගොඩ මහත්මිය - සාමාජික
(අධ්‍යක්ෂ, ජාතික අයවැය මුදල් අමාත්‍යාංශය)

එම්.පී.සී.එම්. මුතුකුමාරණ මහතා - සාමාජික
(ජ්‍යෙෂ්ඨ නීතිඥ)

ඩී.එල්.පී.සී. සේනානායක මහත්මිය
(ලේකම් - කොන්ත්‍රාත් පදනම)

2.2 අධ්‍යයන කටයුතු මණ්ඩලය

එන්.එච්.එම්. චිත්‍රානන්ද මහතා - සභාපති
(ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය) (2020 අගෝස්තු 26 දක්වා)

මහාචාර්ය කපිල පෙරේරා මහතා - සභාපති
(ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය) - 2020 අගෝස්තු 27 සිට)

ආචාර්ය ටී.ඒ.ආර්.ජේ. ගුණසේකර මහත්මිය - සාමාජික
(අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය) (2020 මාර්තු 16 තෙක්)

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා - සාමාජික
(අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය) (2020 මාර්තු 19 සිට)

ආචාර්ය උපාලි සේදර මහතා - සාමාජික
(රාජ්‍ය ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය) (2020 පෙබරවාරි 10 සිට)

මහාචාර්ය නාරද වර්ණසූරිය මහතා - සාමාජික
(හිටපු උපකුලපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

ආචාර්ය බී. විජයරත්න මහතා - සාමාජික
(2020 පෙබරවාරි 10 සිට නොවැම්බර් 24 දක්වා)

මහාචාර්ය එම්.එස්.එම්. අනෙස් මහතා - සාමාජික
(විශ්‍රාමික මහාචාර්ය, දර්ශනය දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

මහාචාර්ය එච්. අබේගුණවරධන මහතා - සාමාජික
(සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන)

ආචාර්ය අයි.එල්. ගිනිගේ මහත්මිය - සාමාජික
(හිටපු සහකාර අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය) (2020 ජූලි 15)

අනුර දිසානායක මහතා - සාමාජික
(අතිරේක ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය) (ජූලි 30 - 2020 තෙක්)

ටී.බී.එම්. අතපත්තු මහතා - සාමාජික
(අතිරේක ලේකම්, (පාලන සහ මුදල්) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය)

අජිතා බටගොඩ මහත්මිය - සාමාජික
(අධ්‍යක්ෂ, රජයේ අයවැය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය)

එම්.පී.සී.එම්. මුතුකුමාරණ මහතා - සාමාජික
(ජ්‍යෙෂ්ඨ නීතිඥ)

ඩී.එල්.පී.සී. සේනානායක මහත්මිය
(ලේකම් - කොන්ත්‍රාත් පදනම මත)

2.2 ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය

පාලක සභාවට අමතරව, අධ්‍යාපන කළමනාකරණය, පාලනය සහ වෙනත් අදාළ ක්ෂේත්‍රවල විශේෂඥයින්ගෙන් සෑදුණු ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ආයතනයේ සියළුම ශාස්ත්‍රීය කටයුතු ගැන වගකීම දරයි. ජාතික අධ්‍යාපන ආයතනයේ පනතේ 11 වන ඡේදයෙන් ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ, බලතල වගකීම් සහ කාර්යභාරය සඳහන් කොට ඇත.

2020 වර්ෂයේ දී පහත සඳහන් අධ්‍යාපන විශේෂඥයන් ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට අයත් විය.

මහාචාර්ය සුදන්ත ලියනගේ මහතා - සභාපති
(වැඩබලන උපකුලපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා - සාමාජික
(අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය)

මහාචාර්ය හුසේන් ඉස්මයිල් මහතා - සාමාජික
(හිටපු උපකුලපති, අග්නිදිග විශ්වවිද්‍යාලය)

ආචාර්ය එස්. රාජදුරෙයි මහතා - සාමාජික
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, විශ්වවිද්‍යාලය, කොළඹ)

ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර මහතා - සාමාජික
(ලේකම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම)

ආචාර්ය ලක්ෂ්මන් පී. වෙඩික්කාරගේ මහතා - සාමාජික
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, විශ්වවිද්‍යාලය, කොළඹ)

බී.ඩී.සී. බියන්විල මහතා - සාමාජික
(ප්‍රධාන කොමසාරිස්, ගුරු අධ්‍යාපනය, අධියාපන අමාත්‍යාංශය) (2020 මැයි 17 තෙක්)

ඊ.එම්.එස්. ඒකනායක මහතා - සාමාජික
(ප්‍රධාන කොමසාරිස්, ගුරු අධ්‍යාපනය, අධ්‍යාපන අමාත්‍යාංශය) (2020 මැයි 18 සිට)

ඩබ්.එම්.ජේ. වික්‍රමනායක මහතා - සාමාජික
(කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය 29 ජූලි 2020 දක්වා)

පී.එන්. ඉලප්පෙරුම මහතා - සාමාජික
(කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය 30 ජූලි 2020 සිට)

බී. සනත් පූජිත මහතා - සාමාජික
(කොමසාරිස් ජනරාල්, විභාග දෙපාර්තමේන්තුව)

ආචාර්ය එස්.ඒ.ඩී. සමරවීර මහතා - සාමාජික
(වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)

කේ. රංජිත් පද්මසිරි මහතා - සාමාජික
(වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - විද්‍යා හා තාක්ෂණ පීඨය)

එන්.වී.ඒ.එස්. සමරසිංහ මහතා - සාමාජික
(වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය)

ඩී.ඒ. ජයලාල් මහතා - සාමාජික
(වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය)

ආචාර්ය වී.ඩී.සී.පී. පෙරේරා මහත්මිය - සාමාජික
(වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - පර්යේෂණ, සැලසුම් හා සංවර්ධන පීඨය)

ඩී.එල්.පී.සී. සේනානායක මහත්මිය
(ලේකම්, කොන්ත්‍රාත් පදනම මත)

ජාතික අධ්‍යාපන ආයතනයට පවරන ලද කාර්යභාරය පහත සඳහන් සංවිධාත්මක ව්‍යුහය යටතේ, පාලක සභාව සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ උපදෙස් සහ මඟපෙන්වීම යටතේ සිදුකෙරේ.

2.3 අධ්‍යක්ෂ ජනරාල්ගේ ලේකම් කාර්යාලය

අධ්‍යක්ෂ ජනරාල්ගේ ලේකම් කාර්යාලය පහත සඳහන් ලෙස, කාර්යාලයක්, එක් ඒකකයක් සහ එක් දෙපාර්තමේන්තුවකින් සමන්විත වේ.

- අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
- අභ්‍යන්තර විගණන ඒකකය
- විභාග දෙපාර්තමේන්තුව

ලේකම් ඒකකය, ජාතික අධ්‍යාපන ආයතනයේ පාලක සභාවටත්, අධ්‍යයන කාර්ය මණ්ඩලයටත් අවශ්‍ය ලිපි ලේඛන සැපයීම, බෙදාහැරීම, පාලක සභාවේ සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තීන්දු තීරණ පිළිබඳ අදාළ පිය සහ අංශ දැනුවත් කිරීම පිළිබඳ වගකීම දරයි. පසුගිය වර්ෂය තුළ, පාලක සභා රැස්වීම් 10ක්ද, අධ්‍යයන කාර්ය මණ්ඩල රැස්වීම් 09ක්ද, ඒකාබද්ධ රැස්වීම් දෙකක්ද පවත්වා ඇත.

විභාග දෙපාර්තමේන්තුව, ප්‍රමිති තත්ත්වයන් පවත්වා ගනිමින් කාර්යක්ෂම ඵලදායී විභාග පද්ධතියක් සැපයීම පිළිබඳ වගකීම දරයි. ජාතික අධ්‍යාපන ආයතනය වෘත්තිය සංවර්ධන පාඨමාලා පැවැත්වීමෙහි යෙදී ඇති බැවින්, සහතික කිරීමේ අවශ්‍යතාව උඩ, ඵලදායී කාර්යක්ෂම විභාග ක්‍රියා පිළිවෙතක් පවත්වා ගෙන යයි. 2020 අවුරුද්ද තුළ පහත සඳහන් පාඨමාලා ඇගයීමකට භාජනය කොට, සහතික පත්ද ලබා දී ඇත.

- පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා - 2019 - පූර්ණකාලීන
- පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා - 2018/2019 - අර්ධකාලීන
- පාසල් කළමනාකරණ ඩිප්ලෝමාව - 2019-2020 (පළමුවන වාරය/සෙමෙස්තරය)
- පාසල් කළමනාකරණ ඩිප්ලෝමාව - 2020-2021 (ඇතුළුවීමේ විභාගය)
- අමතර භාෂා වර්ධන ඩිප්ලෝමාව - 2019
- අධ්‍යාපනවේදී 2017-2021 - පළමු කොටස (විශේෂ)
- බ්‍රේල් අධ්‍යාපනය පිළිබඳ සහතිකය - 2019
- අධ්‍යාපනවේදී - 2017/2021 - පළමු කොටස (විශේෂ)
- උපදේශකත්වය පිළිබඳ ඩිප්ලෝමාව - 2018/2019
- පූර්ව ළමා වර්ධනය - 2019/2020

අභ්‍යන්තර විගණන ඒකකය කෙලින්ම ආයතනයේ අධිපතිට වාර්තා කරයි.

ආයතනයේ අභ්‍යන්තර පාලක පද්ධතිය.

මෙම ඒකකය මගින් ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය ක්‍රියාවේ යෙදවීම, අධීක්ෂණය කෙරේ. මේ සම්බන්ධයෙන් 2020 වර්ෂය තුළ විවිධ දෙපාර්තමේන්තු මඟින් ඉදිරිපත් කෙරෙන රු. 75,000/- වඩා වූ ගෙවීම් සඳහා ලිපිගොනු 38ක හරි වැරදි බැලීමද, විගණන වාර්තා 23ක් සැකසීමද අභ්‍යන්තර විගණන ඒකකය අතින් සිදුකොට ඇත.

2.4 2020 යළි සැකසුණු සංවිධානාත්මක ව්‍යුහය අනුව ආයතනයේ විවිධ දෙපාර්තමේන්තු සහ ඒකක ක්‍රියාත්මක කෙරෙන ආකාරය පහත සඳහන් වේ.

භාෂා, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය

- පෙරපාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- සිංහල භාෂා දෙපාර්තමේන්තුව
- දෙමළ භාෂා දෙපාර්තමේන්තුව
- ඉංග්‍රීසි භාෂා දෙපාර්තමේන්තුව
- සෞන්දර්ය දෙපාර්තමේන්තුව
- ආගම් සහ සාරධර්ම දෙපාර්තමේන්තුව
- සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
- සම්භාව්‍ය භාෂා / විදේශ භාෂා / ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- පිරිවෙන් ඒකකය
- පාසල් පාදක තක්සේරුකරණ ඒකකය

විද්‍යා සහ තාක්ෂණ පීඨය

- විද්‍යා දෙපාර්තමේන්තුව
- ගණිත දෙපාර්තමේන්තුව
- තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- වාණිජ විද්‍යා දෙපාර්තමේන්තුව
- තොරතුරු තාක්ෂණ සහ ඉලෙක්ට්‍රෝනික ප්‍රචාරණ දෙපාර්තමේන්තුව
- සෞඛ්‍ය සහ ශාරීරික අධ්‍යාපන ඒකකය

පර්යේෂණ, සැලසුම් සහ සංවර්ධන පීඨය

- සැලසුම් සහ ඇගයීම් දෙපාර්තමේන්තුව
- පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව
- විදේශ සම්පත් කළමනාකරණ ඒකකය

අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය

- වෘත්තීය සංවර්ධන සහ කළමනාකරණ දෙපාර්තමේන්තුව
- අධ්‍යාපන පාලනය සහ සංවර්ධනය
- විදේශීය පාඨමාලා ඒකකය

ගුරු අධ්‍යාපන සහ විකල්ප අධ්‍යාපන පීඨය

- ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- ආයතනික සංවර්ධන දෙපාර්තමේන්තුව

- අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- පුස්තකාල සහ කෞතුකාගාර දෙපාර්තමේන්තුව
- මාර්ගෝපදේශ සහ උපදේශන ඒකකය
- විවෘත පාසල් ඒකකය

පාලන, මුදල් සහ සහාය සේවා අංශය

- පරිපාලන හා මානව සම්පත් දෙපාර්තමේන්තුව
- මුදල් දෙපාර්තමේන්තුව
- ඉංජිනේරු සේවා සහ නඩත්තු දෙපාර්තමේන්තුව
- මුද්‍රණ සහ ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- ප්‍රවාහන ඒකකය

විශේෂ කාර්යය / 2020 වර්ෂය තුළ ජාතික අධ්‍යාපන ආයතනය ඉටුකර ඇති කාර්යයන්

ආයතනයේ වාර්ෂික ක්‍රියාකාරී සැලසුමට ඇතුලත් කරන විෂයමාලා සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය, අධ්‍යාපනික පර්යේෂණ ආදියට අදාළව, වර්ෂ 2020 සඳහා වූ වාර්ෂික ක්‍රියාත්මක සැලසුමට ඇතුලත් කරන ලද කාර්යයන්ට අමතරව, ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2020 වර්ෂයට අදාළ ව සපුරා ඇති අමතර කාර්යයන් කිහිපයක් වේ.

- ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා, ජාතික අධ්‍යාපන ආයතනයේ නව අධ්‍යක්ෂ ජනරාල් ලෙස 2020 මාර්තු මස පත්කරනු ලැබිණ. කළමනාකරණ විශේෂඥයකු ලෙස කීර්තියක් උසුලන ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න බොහෝ අවුරුදු පුරා දරන ලද වගකීම් සහ ජ්‍යෙෂ්ඨ නායකත්ව භූමිකාවන්ගෙන් ලබාගත් අත්දැකීම් සම්භාරයක් ගෙනඑයි. ජාතික අධ්‍යාපන ආයතනයේ මෙම තනතුර ඉසිලීමට පෙර ඔහු උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් ද, සමාජ බලගැන්වීම් සහ සුභසාධක අමාත්‍යාංශයට උපදේශක වශයෙන්ද කටයුතු කර ඇත. ඊටත් පෙර 1996 සිට 2000 දක්වා ජාතික තරුණ සේවා සභාවේ සභාපති ලෙස කටයුතු කළ කාලය තුළ 'තරුණ ශක්ති' නම් වූ ප්‍රථම යථාවාදී රූපවාහිණී වැඩසටහන ඇතුළු බොහෝ සෙයින් නව්‍ය වූත්, සාතීක වූත්, වැඩසටහන් මෙරට, දක්ෂ තරුණ පිරිස් උදෙසා සැපයීමට නායකත්වය ලබා දී ඇත.

- ජාතික අධ්‍යාපන ආයතනය කළමනාකරණ උපායමාර්ගික සැලැස්ම 2021-2025 සකසා ඇත. මෙමගින් ජාතික අධ්‍යාපන ආයතනය, ජාතික අධ්‍යාපන විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීමේ කේන්ද්‍රීය භූමිකාවක් ඉටු කෙරේ. මෙම උපායමාර්ගික සැලැස්ම මඟින්, ජාතික අධ්‍යාපන ආයතනයට දැනට සතු ශක්තිමත් තත්ත්වය ඉහළට ඔසවා, ජාතික වශයෙන් ද, දේශීය වශයෙන්ද ජාත්‍යාන්තර වශයෙන්ද, ප්‍රමුඛත්වයක් ලබා දෙයි.

- ජාතික අධ්‍යාපන ආයතනය, සිසුනට සතරවන කාර්මික විප්ලවයට මුහුණදීමට හැකිවන සේ, 21 වන ශතවර්ෂ නිපුණතා ලබා ගැනීම් වස්, තම ප්‍රයත්න ආයෝජන සහ අධ්‍යාපන පද්ධතිය 2021-2025 කාල පරාසය තුළ එම නිපුණතා සමඟ පෙළගස්වයි. 2021-2025 උපාය මාර්ගික සැලැස්ම ජාතික අධ්‍යාපන ආයතනයේ නව අධ්‍යක්ෂ ජනරාල් වූ ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතාගේ සෘජු අධීක්ෂණය යටතේ සිදු කෙරේ.

- එකම විෂයමාලාවක් යටතේ, පෙර පාසලේ සිට තෘතීය අධ්‍යාපන මට්ටම දක්වා සියළු දරුවන් බලගන්වනු වස්, ගුණාත්මක අධ්‍යාපනයක් සැපයීමේ අරමුණ ඇතිව, ජාතික අධ්‍යාපන ආයතනය, සාමාන්‍ය අධ්‍යාපනය උදෙසා, ජාතික විෂයමාලා රාමුවක්, සැලැසුම් කොට, ගොඩනැගීමේ කාර්යය සපුරා ඇත. මේ සම්බන්ධයෙන් ජාතික අධ්‍යාපන ආයතනය, අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ආදියෙහි නිලධාරීන් සමඟ සාකච්ඡා වැඩමුළු මාලාවක් ම පවත්වා ඇත. ගරු අමාත්‍ය, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල සහ දුරස්ථ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සහ ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ 2020ට ඔබ්බෙන් යෝජිතක විෂයමාලා ප්‍රතිසංස්කරණ වලට අදාළ ජාතික විෂයමාලා රාමුව අවසන් කොට ඇත.

  තව දුරටත් ඉගෙනුම් ඵල වැඩ සටහන සහ ජාතික අධ්‍යාපන පරමාර්ථ හඳුනාගනු ලැබීමේ කාර්යය ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපනඥයින් විසින් කෙරෙමින් පවතී.

- කොවිඩ් 19 වසංගතය, මුළු ලොව පුරා පැතිරෙමින් ගෝලීය ව්‍යසන තත්ත්වයකට එළඹ ඇති බැවින් ලොව පුරාම අමතර සෞඛ්‍ය ක්‍රියාමාර්ගයන් ගැනීමට රජයන්ට සිදුවී ඇත. ශ්‍රී ලංකා රජයද, කොවිඩ් 19 වසංගතය, පාලනය කිරීමටත්, වළක්වා ලීමටත් ආධාරවන ප්‍රයත්නයන් කිහිපයක්ම ආරම්භ කොට ඇත. එක් ප්‍රමුඛ ක්‍රියාමාර්ගයක් වූයේ 'සමාජ දුරස්ථ බව' ඇතුළත් ආක්‍රමණශීලි ක්‍රියාමාර්ගයන්හි ප්‍රතිඵල ලෙස පාසල් වසා දැමීමය. එහි ප්‍රතිඵලයක් ලෙස, අධ්‍යාපන අමාත්‍යාංශයද, ජාතික අධ්‍යාපන ආයතනයද, වෙනත් නිලධාරීන්ද එක්ව ශ්‍රේණි 5, 11 සහ 12, 13 සඳහා පාඩම් සම්පාදනය කොට ප්‍රචාරණය කිරීම සඳහා සැලසුම් කොට ඇත. වර්ෂය අවසානය වනවිට ජාතික අධ්‍යාපන ආයතනය, උසස් පෙළ සඳහා රූපවාහිනී පාඩම් 2140ක්ද 11 වන ශ්‍රේණිය සඳහා රූපවාහිනී පාඩම් 1596 ක්ද, පස්වන ශ්‍රේණිය සඳහා (ගුරු ගෙදර) රූපවාහිනී වැඩසටහන් 280 ක්ද සම්පාදනය කොට ඇත.

- පසුගිය දෙසැම්බර් මාසයේ විසිදෙවන ජාතික ප්‍රාදේශීය ඉගෙනුම් උපකාරක මධ්‍යස්ථාන සම්මේලනයත් රටවල් පහක සහභාගීත්වයෙන් යුතුව, සහභාගිවන්නන් 600ක් උදෙසා භාෂා තක්සේරුකරණය 2020 පිළිබඳ සත්වන ජාතික සම්මේලනයත් පවත්වන ලදි.

3.0 විෂයමාලා සංවර්ධනය

ජාතික අධ්‍යාපන ආයතනයේ එක් ප්‍රධාන වගකීමක් වනුයේ සාමාන්‍ය අධ්‍යාපනය උදෙසා විෂයමාලා පිරිසැලසුම් කිරීමත්, වර්ධනය කිරීමත් ය. විෂයමාලා සංවර්ධන ක්‍රියාකාරකම්, ජාතික අධ්‍යාපන ආයතනයේ, භාෂා මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨයත්, විද්‍යා හා තාක්ෂණික පීඨයත් මඟින් ඉටුකෙරේ.

2020 වර්ෂයේදී විෂ්‍යමාලා වර්ධනය සම්බන්ධයෙන් පහත සඳහන් කාර්යයන් ක්‍රියාවේ යොදවා ඇත.

3.1 ප්‍රාථමික අධ්‍යාපනය

පෙරපාසල් සඳහා වූ ජාතික විෂයමාලා රාමුවෙන් 60% සපුරා ඇත.

3.2 ද්විතීය අධ්‍යාපනය

- අනාගත සාමාන්‍ය අධ්‍යාපන විෂයමාලාව ප්‍රතිසංස්කරණය කිරීමේ, හැරවුම් ලක්ෂණ හඳුනාගැනීමටත්, ජාතික සංවර්ධන ප්‍රමුඛතා උදෙසා ප්‍රාදේශීය වශයෙන් ආධාර ලබා ගැනීමටත්, ශ්‍රී ලංකා සාමාන්‍ය අධ්‍යාපනය උදෙසා ජාතික විෂයමාලාවන් සකස් කරන ලදි.
- ශ්‍රේණි 6-11 සඳහා ගෝලීය පුරවැසි අධ්‍යාපන සංවර්ධනය සඳහා විෂයමාලා රාමුවේ අවසාන කෙටුම්පත සකසා ඇත.
- ශ්‍රේණි 12-13 සඳහා මාධ්‍ය අධ්‍යාපනය; ගුරු මාර්ගෝපදේශක දෙකක් ඉංග්‍රීසියට සහ දෙමළ බසට පරිවර්තනය කර ඇත.
- නවවන ශ්‍රේණිය උදෙසා දෙවන ජාතික භාෂාව; (දෙමළ බස)ට අදාළ වැඩපොතේ අවසාන කෙටුම්පත සකසා ඇත.
- පාසල් විෂයමාලාවට, ප්‍රායෝගික ගණිතය සංකල්පය හඳුන්වාදීම සඳහා දහවන ශ්‍රේණියට කාර්යයන් 10 කෙටුම්පත් කිරීමද, 6 වන ශ්‍රේණිය සඳහා සඳහා කාර්යයන් 15ක් සංශෝධනය කිරීමද අවසන් කොට ඇත.

- ශ්‍රේණි 6-12 සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මක බව දියුණු කරනු වස් සාමාන්‍ය අධ්‍යාපනය නවීකරණය (GEMP) ව්‍යාපෘතියෙන් තෝරා ගන්නා ලද ගුරුවරුන් (33) තිස්තුන්දෙනෙකු පුහුණු කිරීමත්, ගුරු පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය කිරීමත් අවසන් කොට ඇත.
- වාණිජ විෂයයන්ට අදාළ වචන මාලාව හඳුනා ගැනීමටත් ඉගෙන ගැනීමටත් සිසුනට ආධාර වන සේ, වාණිජ අධ්‍යාපනයට අදාළව ඉංග්‍රීසි බසින් හා සිංහල බසින්, වාණිජ අධ්‍යාපනය නිසන්ටුව සකසා අවසන් කෙටුම්පත නිමා කොට ඇත.
- ආයාදහම් නවරාත්‍රී සඟරාව නිමාකොට ඇත.
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වර්ධනය කිරීම සඳහා 6 -13 ශ්‍රේණිවලට අදාල අධ්‍යාපන මෘදුකාංග 10 ක් සකසා ඇත.
- වාර්ෂික ප්‍රාදේශීය ඉංග්‍රීසි උපකාරක මධ්‍යස්ථාන සම්මේලනය මාර්ගස්ථව පවත්වන ලදී.
- පළාත් නවයෙන් දෙකකට අදාලව මාධ්‍ය අධ්‍යාපනය උදෙසා, කලාප මට්ටමින්, ගුරු සංචිතයන් ගොඩනැගීම් වස් සම්පත් පුද්ගලයන් හඳුනා ගැනීම නිම කොට ඇත.
- පිරිවෙන් අධ්‍යාපනයේ විෂය අධ්‍යක්ෂවරුන් සහ සේවස්ථ උපදේශකයින් 406 දෙනෙකු සඳහා - මාර්ගස්ථ ධාරිතා / ශක්‍යතා වර්ධන වැඩසටහන් පැවැත්වීම.
- තක්සේරුකරණය තුළින්, අපේක්ෂිත විෂයමාලා ඉගෙනුම් ඵල, ලබා ගැනීමටත් සිසුන්ට පහසුකම් සැපයීම සම්බන්ධයෙන් ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන් 180 ක් සඳහා තක්සේරුකරණය පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම.
- ද්විභාෂා අධ්‍යාපනය පිළිබඳ දේශීය සම්මන්ත්‍රණයට එක් ලිපියක් ඉදිරිපත් කර ඇත. සම්මන්ත්‍රණයට අදාලව ලිපි දෙකක් සමාලෝචනය කරන ලදී.
- ද්විභාෂා අධ්‍යාපනයට අදාළ පළමු පියවරේ පර්යේෂණ යෝජනාවක දෙවන කෙටුම්පත ගොඩනගා ඇති අතර, ලේඛනගත අධ්‍යයනයේ ඉලක්ක වන පරිච්ඡේද දහයෙන්, පළමු හය ගොඩනගා ඇත.
- සහතික කරන ලද 13 අවුරුදු අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධ්‍යයනය නිමා කොට ඇත.

4.0 අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණය

අධ්‍යාපන නායකත්ව සංවර්ධන **හා** කළමනාකරණ පීඨයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ, අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ගේ කළමනාකරණ සහ නායකත්ව ධාරිතාව උද්දීපනය කිරීම වේ.

ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීම්වස්, අධ්‍යාපන කළමනාකරණය, පාසල් පරිපාලනය ආදියට අදාලව ඩිප්ලෝමා මට්ටමේ සිට ශාස්ත්‍රපති මට්ටම දක්වා විවිධ පාඨමාලා, පීඨය මගින් පවත්වනු ලැබේ.

2020 වර්ෂය තුළ අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණය මගින් ක්‍රියාත්මක කෙරෙන පාඨමාලාවන්හි ප්‍රගතිය පහත ලැයිස්තුවෙන් ප්‍රකාශ කෙරේ.

පාඨමාලාවේ නම	වගකිව යුතු දෙපාර්තමේන්තුව	සහභාගී වන සංඛ්‍යාව
<u>පශ්චාත් උපාධි පාඨමාලා</u> අධ්‍යාපන කළමනාකරණ විද්‍යාපති	වෘත්තීය සංවර්ධනය සහ අධ්‍යාපනය	34
<u>පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා</u> අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (පූර්ණකාලීන/අර්ධකාලීන)	වෘත්තීය සංවර්ධනය සහ අධ්‍යාපනය	343
<u>ඩිප්ලෝමා පාඨමාලා</u> පාසල් කලමණාකරණය - ඩිප්ලෝමාව	වෘත්තීය සංවර්ධනය සහ අධ්‍යාපනය	268

ඉහත සඳහන් පාඨමාලාවනට අමතරව සිංහල සහ දෙමළ මාධ්‍ය අධ්‍යාපන කළමනාකරණ උපාධි පාඨමාලා මාර්ගෝපදේශයන් 90%ක් සම්පූර්ණ කොට ඇත.

5.0 වෘත්තීය සංවර්ධනය

නව්‍ය ගුරු අධ්‍යාපන මාදිලි භාවිතයෙන් විවිධ වූත්, විශාල වූත් ගුරු කාර්යමණ්ඩලවල වෘත්තීය සංවර්ධන අවශ්‍යතා සැපයීම සම්බන්ධයෙන් දීර්ඝ හා සැලකිය යුතු ඉතිහාසයක් ජාතික අධ්‍යාපන ආයතනයට ඇත. ඕනෑම පාඨමාලාවක අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගැනීම හෝ පද්ධතිය මගින් හඳුන්වාදෙන වෙනත් සංවර්ධන ආරම්භයන් හෝ ගුරු සාධකය මත රඳා පවතී. ගුරුවරුන් ඵලදායී වෘත්තිකයන් වීමට අවශ්‍යවන අවබෝධය, නිපුණත්වය සහ ආත්ම විශ්වාසය ලබා දීමේ අරමුණින්, උසස් තත්වයේ පාඨමාලා සපයා දීමෙන් මෙම කාර්යභාරය ඉටුකෙරේ. මේ සඳහා දර්ශනපති මට්ටමේ සිට සහතික මට්ටම දක්වා විවිධ ගුරු අධ්‍යාපන පාඨමාලා අදාළ ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුවලින් සහ විෂයමාලා සංවර්ධන දෙපාර්තමේන්තුමගින් පැවැත්වේ.

පහත සඳහන් වගුවෙන් භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ විවිධ දෙපාර්තමේන්තු සහ ගුරු අධ්‍යාපන සහ විකල්ප අධ්‍යාපන පීඨය මගින් ක්‍රියාත්මක වන පාඨමාලා ප්‍රගතිය පහත දැක්වෙන වගුවෙන් පෙන්නුම් කෙරේ.

පාඨමාලාවේ නම	වගකිව යුතු දෙපාර්තමේන්තුව	සහභාගීවන්නන්
<u>පශ්චාත් උපාධි පාඨමාලා</u>		
දර්ශනපති	ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව	52
අධ්‍යාපන විද්‍යාව පිළිබඳ ශ්‍රාස්ත්‍රපති	ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව	257
<u>පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා</u>		
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව	ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව	3216
උපාධි පාඨමාලා		
අධ්‍යාපනවේදී (ගෞරව)	ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව	713
අධ්‍යාපනවේදී (සාමාන්‍ය)	ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව	3210
අධ්‍යාපනවේදී (ඉංජිනේරු)	ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව	120
<u>ඩිප්ලෝමා පාඨමාලා</u>		
දෙවන බසක් ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ඩිප්ලෝමාව	ඉංග්‍රීසි භාෂා දෙපාර්තමේන්තුව	15
පූර්ව ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාව	මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපා.	49
විශේෂ අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාව	අන්තර්කරණ අධ්‍යාපන දෙපා.	91
සංඥා භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව	අන්තර්කරණ අධ්‍යාපන දෙපා.	30
උපදේශනය සහ මාර්ගෝපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව	උපදේශන හා මාර්ගෝපදේශන ඒකකය	129
අමතර භාෂා වර්ධනය පිළිබඳ ඩිප්ලෝමාව	ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව	225
<u>කෙටිකාලීන පාඨමාලා</u>		
ගණිතය ඉගැන්වීම සඳහා උසස් සහතිකපත්‍ර පාඨමාලාව	ගණිත දෙපාර්තමේන්තුව	89
අධ්‍යාපන පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ තේමා පාඨමාලාව	පර්යේෂණ හා සංවර්ධන දෙපා.	34

ජාතික අධ්‍යාපන පීඨ මගින් (NCOE) පවත්වනු ලබන පූර්ව සේවා ගුරු අධ්‍යාපන වැඩසටහන් වලටත්, ගුරු අභ්‍යාස විද්‍යාලය (TTC) මගින් පවත්වනු ලබන සේවස්ථ ගුරු පුහුණු අධ්‍යාපන වැඩසටහන් වලටත් අදාල විෂයමාලා සංවර්ධනයට, ජාතික අධ්‍යාපන ආයතනය වගකිව යුතු වේ. 2020 වර්ෂයේදී පහත සඳහන් මැදිහත්වීම් මේ සම්බන්ධයෙන් සපුරා ඇත.

- උපදේශන කමිටු තීරණ වලට අනුව, ජාතික අධ්‍යාපන පීඨයන්හි අධ්‍යාපන උපාධි පාඨමාලාව උදෙසා, විස්තරාර්ථ පාඨමාලා අනතඟිත 56 ක් සකසා අවසන් කොට ඇත.
- ප්‍රශ්න පත්‍ර 15 ක් සකසා ජාතික අධ්‍යාපන පීඨ අභ්‍යන්තර විභාග දෙකෙන් එකක් නිමාකොට ඇත.
- පූර්ව සේවා අධ්‍යාපනයට අදාලව ගුරු අධ්‍යාපනඥයින් පුරවැසි නිපුණතා, ධාරිතාව ශක්තිමත් කරනු වස්, මොඩියුල 600 ක් මුද්‍රණය කිරීමේ කාර්යය කෙරෙමින් පවතී. ඉගැනුම් අභ්‍යාස නිරීක්ෂණය සඳහා තෙවරක් ආයතන වෙත ගොස් ඇති අතර, ක්‍රියාකාරකම් 10 ක් සකස් කොට ඇත.

6.0 විකල්ප අධ්‍යාපනය

ඉහත සඳහන් කාර්යයභාර ක්‍රියාත්මක කිරීමට අමතරව, ගුරු අධ්‍යාපන පීඨය ද, විකල්ප අධ්‍යාපන පීඨය ද, විශේෂයෙන්ම විවිධ හේතූන් නිසා ප්‍රධාන අධ්‍යාපන ධාරාව මඟහැරුණු අය සඳහා, ඉගෙනුම් අවස්ථා පුළුල් කිරීමේ කාර්යය වෙත තම සැලකිල්ල යොමු කොට ඇත.මේ සම්බන්ධයෙන් පීඨය, ‘‘සැමට අධ්‍යාපනය’’ , ‘ජීවිතය පුරා අධ්‍යාපනය’ ආදි සංකල්ප වලට සහාය දෙන අතර, වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනයට අදාල සේවා, මාර්ගෝපදේශනය සහ උපදේශන ඒකකයෙන් ලබා දෙනු ලැබේ.

6.1. අන්තර්කරණ අධ්‍යාපනය

<u>සැමට අධ්‍යාපනය</u> යන සංකල්පය යථාර්තයක් බවට පත් කිරීමේදී අන්තගීත අධ්‍යාපන දෙපාර්තමේන්තුව සුවිශේෂී තැනක් උසුලයි. මෙම දෙපාර්තමේන්තුව, විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට සරිලන සේ , පාසල් විෂයමාලාව උචිත ලෙස සකසා ගැනීම, විශේෂ අධ්‍යාපනයෙහි නියුක්ත ගුරුවරුන් සහ සේවස්ථ උපදේශකයන්ට අවශ්‍ය පුහුණුව සපයා දීම, අමතර විෂයමාලා කරුණු සූදානම් කිරීම ආදිය සම්බන්ධයෙන් ද වගකීම දරයි. තව ද ඔවුනට සංඥා භාෂාව, බ්‍රෙල් අධ්‍යාපනය සහ අන්තගීත අධ්‍යාපනය, ආදියට අදාල පාඨමාලා සැපයීමෙන්, වෘත්තීය වර්ධනය ද සපයා දෙනු ලැබේ.

- භාෂාව, ගණිතය, පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරම් ඇතුළුව ගුරු මාර්ගෝපදේශකයට අනුගතව සිංහල පාඩම් 20 ක්ද, සේවස්ථ සිද්ධි අධ්‍යයන 10ක්ද නිමා කර ඇත.
- අන්තර්ගත අධ්‍යාපනයට අදාළ සඟරාවක් ප්‍රකාශයට පත්කොට ඇත.
- විශේෂ අධ්‍යයන අවශ්‍යතා ඇති සිසුන් 21දෙනෙකු හඳුනාගෙන එම සිසුනට ද ඔවුන්ගේ දෙමාපියන්ට ද මාර්ගෝපදේශනය සපයන ලදි.
- දැනට ආබාධිත (චලනය සහ දිශානතිය) තත්ත්වය සඳහා අමතර ඉගෙනුම් දෑ සකසා ඇත.
- දෙමළ මාධ්‍යයෙන් ඕටිසම් තත්ත්වයෙන් (autism) පෙළෙන දරුවන් සඳහා අමතර පොතක් සකසා ඇත.

6.2 මාර්ගෝපදේශනය සහ උපදේශනය

උගත් සමාජයක මානසික අවශ්‍යතා සපුරාලීම උදෙසා, මාර්ගෝපදේශනයට හා උපදේශනයට ඒකකයක් 2006 ජූනි මස ආරම්භ කරන ලදි. පාසල් පාර්ශවකරුවන් සඳහා, වෘත්තිය මාර්ගෝපදේශනය සහ උපදේශන සේවා සැපයීම මෙම ඒකකයේ වගකීම වේ. 2020 වර්ෂය තුළ පහත සඳහන් කාර්යභාරයන් නිමා කොට ඇත.

- පාසල් සිසුන් 55ක් සහ ඔවුන්ගේ දෙමාපියන් සඳහා ආයතනගත නොවන උපදේශන සැසි පවත්වන ලදි.
- වෘත්තීය මාර්ගෝපදේශනය උදෙසා සිංහල ගුරු මාර්ගෝපදේශනයක් සකසා ඇත.
- යෝජිත වෘත්තීය මාර්ගෝපදේශන ඩිප්ලෝමාව උදෙසා, විෂයමාලාව කෙටුම්පත්කොට, මොඩියුල අන්තර්ගතය කෙටුම්පත් කරන ලදි.
- උපදේශන ඩිප්ලෝමාවට අදාළ විෂයයට තුනෙන් දෙකක් සමාලෝචනය නිම කොට ඇත.

6.3 විවෘත ඉගෙනුම

විවිධ හේතූන් නිසා නිල අධ්‍යාපනය මහහැරීගිය කණ්ඩායම් උදෙසා, දුරස්ථ සහ විවෘත අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ පරමාර්ථය ඇතිව විවෘත පාසල් එ්කකය ස්ථාපිත කරන ලදි. දුරස්ථ සහ විවෘත ක්‍රම උපයෝගි කර ගැනීමෙන්, මෙම ක්‍රියාවලිය අධ්‍යාපනය ඉගෙනුම ලබන්නන් වෙත ගෙන යයි. අධ්‍යාපන සුදුසුකම් රැකියාවේ සමාජීය සංස්තෘජ්ත භාවය කුමක් වුවද මෙම ක්‍රියාවලිය මඟින් සියළු දෙනාහට අධ්‍යාපන අවස්ථා සැපයීම පුළුල් කිරීම අපේක්ෂා කෙරේ. විවෘත පාසල්, ඉගෙනුම ලබන්නන්ට, ඉගෙනුම ආරම්භ කළ යුත්තේ කුමන වේලාවකද, කුමන මාදිලියක් උපයෝගි කළ යුතුද, යන්න තීරණය කිරීම පහසුකරවන අතර, සුදුසු ඕනෑම පියවරක දී ඉගෙනුම ආරම්භ කිරීමට ද ආධාර කෙරේ.

විවෘත ඉගෙනුම වැඩසටහන සම්බන්ධයෙන් පහත සඳහන් කාර්යයන් 2020 වර්ෂයේදී නිමා කොට ඇත.

- ඉගෙනුම ලබාදෙන්නන් සඳහා ගණිතය සහ විද්‍යාවට අදාළව අතිරේක පොත් දෙකක් සකසා ඇත.
- රටෙහි ඇතිවූ කෝවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ස්ථාපිත කිරීම පමාවූ මධ්‍යස්ථාන 8ක් ආරම්භ කොට ඇත. පවතින මධ්‍යස්ථාන ප්‍රතිව්‍යුහගත කිරීම් සහ ප්‍රාදේශීය මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම පිළිබඳ අවශ්‍යතා පරීක්ෂණය නිමා කොට වාර්තාව සකසා ඇත.
- ඉගෙනුම ලබන්නන්ට ආධාර සැපයීම සඳහා ප්‍රාදේශීය ඉගෙනුම මධ්‍යස්ථානයන් හි, ඉගෙනුම් සැසි 24ක් පවත්වා ඇත.
- ප්‍රගති සමාලෝචන රැස්වීම් දෙකක් පවත්වා ඇති අතර, ඉගෙනුම් මධ්‍යස්ථාන දෙකක් සුපරීක්ෂණය සඳහා (පුද්ගලිකව) ක්‍රියාකොට ඇත.
- ඉගෙනුම ලබන්නන් 87 දෙනෙකු සඳහා, විවෘත පදනම් පාඨමාලාවද, ඉගෙනුම ලබන්නන් 94 දෙනෙකු උදෙසා සාක්ෂරතා පාඨමාලාවද, 823 දෙනෙකු උදෙසා විවෘත ද්විතීය පාඨමාලාව අධීවශයෙන්ද නිමා කොට ඇත.
- 2020 වර්ෂය තුළදී, පදනම් පාඨමාලාව සඳහා 145 දෙනෙකු ද, ද්විතීය පාඨමාලාව සඳහා 950 දෙනෙකුද, සාක්ෂරතා පාඨමාලාව සඳහා 105 දෙනෙකුද බඳවා ගෙන ඇත.

6.4 අධ්‍යාපන කෞතුකාගාරය

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය සංරක්ෂණය කෙරෙන ප්‍රධාන මධ්‍යස්ථානය වනුයේ, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපන කෞතුකාගාරයය. එහි ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය පිළිබඳ තොරතුරු වටිනා භාණ්ඩ ආදිය එක්තැන්කොට ප්‍රදර්ශනය කරනු ලැබේ. සමහර වැදගත් භාණ්ඩ එකතුව අතර, ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර තුමා පිළිබඳ මතක වස්තූන් වන ඔර්ලෝසුව, ජාතික ඇඳුම, අත්අකුරු සාම්පල වේ. තවද ඒ අතර, ශ්‍රී ලංකා සාමාන්‍ය අධ්‍යාපනයට අදාළ අධ්‍යාපන චක්‍රලේඛන, ඉගෙනුම් ඉගැන්වීම් භාණ්ඩ සහ පැරණි ලිවීමේ උපකරණ ද වේ.

- දැනුම සහ විනෝදය සැපයීම සඳහා එක් ප්‍රදර්ශන භාණ්ඩයක් නිමා කොට ඇත.
- ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය පිළිබඳ දැනුමට අදාළව ප්‍රදර්ශන පුවරු දෙකක් ද, එක් කුඩා පොතක්ද නිමා කොට ඇත.

6.5 පුස්තකාලය

ජාතික අධ්‍යාපන ආයතනයේ පුස්තකාලය, අභ්‍යන්තර කාර්ය මණ්ඩලයට අමතරව, විශ්ව විද්‍යාල සේවා මණ්ඩලය, ජාතික අධ්‍යාපන පීඨ සහ ගුරු පුහුණු විද්‍යාල කාර්ය මණ්ඩල, ගුරුවරුන් සිසුන් සහ තවත්, ශාස්ත්‍රීය කටයුතු වල නියැලි අය විසින් පරිහරණය කරනු ලැබේ.

පහත සඳහන් පොත් සහ සීඩී (CD) තැටි 2020 වර්ෂයේ පුස්තකාල භාණ්ඩවලට එකතු කරන ලදී.

පොත්	1311
ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රකාශන	129
විෂයමාලා ද්‍රව්‍ය	53
පොත් ප්‍රදාන	05
සීඩී (CD) තැටි	32
විදේශීය සඟරා	06
දේශීය	29
දේශීය ප්‍රකාශන (ප්‍රදාන)	20
විදේශ සඟරා ප්‍රදාන	15
තොරතුරු ලිපි	05
අධ්‍යාපන වාර්තා	04

7.0 පර්යේෂණ, සැලසුම් කිරීම සහ සංවර්ධනය

මෙම පීඨයේ ප්‍රධාන වගකීම් වනුයේ, අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ අධ්‍යයන කිරීමත්, උපාය මාර්ගික කළමනාකරණ සැලසුම සැකසීමත් හා වාර්ෂික කළමනාකරණ සැලසුම් සැකසීමත්, භෞතික සහ යටිතල පහසුකම් ඇතිව පුනරාවර්තන හා සෑම මූල්‍ය වියදමක් ඇතුළුව ඇස්තමේන්තු සැලසුම් කිරීමත්, ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයේ වෘත්තීය ධාරිතාව උද්දීපනය කිරීමත් ය. මෙම කටයුතු පර්යේෂණ සංවර්ධන සහ සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ද, සැලසුම් සහ ඇගයීම් සහ විදේශ සම්පත් කළමනාකරණ ඒකකය මඟින් ද සපුරාලනු ලැබේ.

7.1 පර්යේෂණ සහ සංවර්ධන

පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන් වනුයේ, අධ්‍යාපන පර්යේෂණ ආරම්භ කොට, වර්ධනය කොට පැතිරවීම, සාකච්ඡා සහ වාද විවාද අවශ්‍යවන අධ්‍යාපන ගැටළු තත්ත්වයන් ආමන්ත්‍රණය කිරීමට වේදිකාවක් සැකසීම, පාඨමාලා පැවැත්වීමෙන්, මුදල් ආධාර සැපයීමෙන්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ කටයුතු කරන නිලධරයන්ට අවස්ථා සැපයීම සහ පර්යේෂණ තොරතුරු විසුරුවා හැරීමත් ය.

2020 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ කැපී පෙනෙන සාතීකත්වයන් පහත සඳහන් වේ.

- 2020 සී.ඩී.ඩබ්.ඩබ්. කන්නන්ගර අනුස්මරණ දේශන, සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍ය තුනෙන්ම මුද්‍රණය කිරීම; රටේ ඇතිවූ කොවිඩ් 19 වසංගත හේතුවෙන්, මෙම දේශන පැවැත්වීම කල් දැමීමට සිදුවිය.
- පර්යේෂණ සඟරාවේ ආකෘතිය (dummy) නිමාකොට මුද්‍රණය සඳහා භාර දෙන ලදි.
- සහභාගීවන්නන් 55 දෙනෙකු උදෙසා පර්යේෂණ සම්මන්ත්‍රණයක් මාර්ගගතව සංවිධානය කරන ලදි.
- පර්යේෂණ ප්‍රකාශන සමාලෝචනයන්, රැස්කිරීමත් යන දෙකටම අදාළව දත්ත පදනමක් වර්ධනය කර ඇත.
- පහත සඳහන් මාතෘකා යටතේ, පර්යේෂකයින් හතර (4) දෙනෙකු සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් දෙකක් පැවැත්විය. අවුරුදු දෙකක පර්යේෂණ දීමනා පිළිබඳ එක් කෙටුම්පත් වාර්තාවක් ලබා ගෙන ඇත.
- යාපනය සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ද්විතීය පාසල් සිසුන් අතර, මානසික ක්‍රියාකාරීත්වය පොළඹවන යෙදුම් භාවිතය සහ අවදානම් අඩු කිරීමේ මැදිහත්වීම්
- ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට යෝජිත (STEM) විසින් ඉගැන්වීම් සහ ඉගෙනීම් නවීකරණයට අදාළ සංකල්පිත රාමුව
- ශ්‍රී ලංකාවේ පාසල් අතර සම්පත් බෙදාහැරීම පිළිබඳ අධ්‍යයනයක්
- ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන පීඨ පුහුණු වැඩසටහන්වලට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරු පුහුණුවන්නන් මුහුණ දෙන ගැටළු
- තොරතුරු ලිපියේ e - විචල්‍යය සම්පූර්ණකොට, ජාතික අධ්‍යාපන ආයතනයේ වෙබ් අඩවියට ඇතුළු කොට, ශ්‍රී ලංකාවේ, වර්තමාන අධ්‍යාපන භාවිතයන් ගැන අදාළ පාර්ශවකරුවන් සඳහා වේදිකාවක් විවෘත කිරීම.

7.2 සැලසුම් කරණය සහ ඇගයීම

ජාතික අරමුණු වලට අනුගතව, පවතින මිනිස් සහ භෞතික සම්පත් ඵලදායී ලෙස සහ කාර්යක්ෂමව යොදා ගැනීමෙන් ජාතික අධ්‍යාපන ආයතනයේ ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම් වස්, සැලසුම් කරණය සහ ඇගයීම් යටතේ, පහත සඳහන් කාර්යයන් සපුරා ඇත.

- වාර්ෂික ප්‍රගති වාර්තාව සැකසීම (ඉංග්‍රීසි) 2019
- උපායමාර්ගික කළමනාකරණ සැලැස්ම සැකසීම 2021-2025
- අයවැය ඇස්තමේන්තු සැකසීම: වාර්ෂික අයවැය දෙපාර්තමේන්තුව සහ 2021 වර්ෂය උදෙසා වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම
- සංශෝධිත වාර්ෂික සැලැස්ම සහ 2020 වර්ෂය සඳහා ඇයවැය.
- 2020 වර්ෂය තුළ දේශීය සහ විදේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක කරන ලද කටයුතු වලට අදාළ ත්‍රෛමාසික ප්‍රගති වාර්තා හතරක් (04) සැකසීම.
- වෙනත් ආයතන වලින් ඉල්ලුම් කරන ලද පහත සඳහන් ප්‍රගති වාර්තා සැකසීම.
- මහ බැංකුව සඳහා ප්‍රගති වාර්තා දෙකක් (02)
- මහා භාණ්ඩාගාරය සඳහා ප්‍රගති වාර්තා හතරක් (04)
- විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මක වන UNICEF සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය GFMP ආයතන සඳහා ත්‍රෛමාසික ප්‍රගති වාර්තා

7.3 විදේශ සම්පත් කළමනාකරණ ඒකකය

සියළු විදේශ ශිෂ්‍යත්ව සහ අධි ශිෂ්‍යත්ව ඒකරාශි කිරීමේ වගකීම විදේශ සම්පත් කළමනාකරණ ඒකකය මඟින් දරණු ලැබේ. පසුගිය අවුරුදු පහ (05) තුළ දී, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට තම වෘත්තීය කුසලතා වර්ධනය කර ගැනීම සඳහා කෙටිකාලීනව සහ දිගු කාලීනව විදේශගතවීමේ අවස්ථා ගණනාවක් සලසා ඇත.

2020 වර්ෂයට අදාල සාර්ථකව සම්පූර්ණ කළ කාර්යයන් පහත සඳහන් වේ.

- සාමාන්‍ය අධ්‍යාපන නවීකරණය ව්‍යාපෘතිය (GEMP) යටතේ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවට සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගේ ඉල්ලුම්පත්‍ර එක්රැස් කිරීම.
- පූර්ව ළමාවියට අදාළ e - වැඩ සටහන් සංවිධානය කිරීම.

8.0 පරිපාලනය, මූල්‍ය සහ සහාය සේවා

පරිපාලනය මූල්‍ය සහ සහාය සේවා අංශයේ ක්‍රියාභාරය වනුයේ, ආයතනයේ පීඨ පහට (5) අදාළ ක්‍රියාභාරයන්ට අවශ්‍ය මූල්‍ය, භෞතික, කළමනාකරණ සහ සේවා සැපයීමය.

8.1 පරිපාලන හා මානව සම්පත් දෙපාර්තමේන්තුව

පරිපාලනය, මූල්‍ය සහ සහාය සේවා අංශයට යටත්, පරිපාලන හා මානව සම්පත් දෙපාර්තමේන්තුව, එදිනෙදා පරිපාලනයත්, කාර්ය මණ්ඩලයට අදාළ පුහුණු අවශ්‍යතා හඳුනාගැනීමත්, දේශීය මට්ටමෙන් එම අවශ්‍ය පුහුණුව සැපයීමත් ආදියට අදාළ සෑම ක්‍රියාකාරීත්වයක්ම සම්බන්ධයෙන් වගකීම උසුලයි. 2020 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් කාලය තුළ පරිපාලන හා මානව සම්පත් දෙපාර්තමේන්තුව මඟින් පහත සඳහන් බඳවා ගැනීම් සහ උසස්වීම් සලසා ඇත.

<u>බඳවා ගැනීම්</u>

සහකාර කථිකාචාර්ය තනතුරු	02
කාර්මික නිලධාරී තනතුරු	01

<u>උසස්වීම්</u>

අධ්‍යක්ෂ තනතුරු	01
ප්‍රවාහන නිලධාරී	01
විභාග නිලධාරී	01
කළමනාකරණ සහකාර 1 වන ශ්‍රේණිය තනතුරු	10
කළමනාකරණ සහකාර 2 වන ශ්‍රේණිය තනතුරු	07
කාර්යාල ආධාරක 1 වන ශ්‍රේණිය	04
කාර්යාල ආධාරක 2 වන ශ්‍රේණිය	04

- ඉල්ලුම් කරන ලද අධ්‍යයන වැඩසටහන් වලට සහභාගි වීමට, අධ්‍යයන සහ අනධ්‍යයන නිලධාරින් තුන්සිය අනූදෙනෙකුට (392) අධ්‍යයන නිවාඩු ද මූල්‍ය ආධාර ද සපයා ඇත.

8.2 මුදල් දෙපාර්තමේන්තුව

මුදල් දෙපාර්තමේන්තුව, ආයතනයේ සෑම ක්‍රියාකාරීත්වයක්ම සඳහා, මූල්‍ය සම්පත් සපයා, මුදල් රෙගුලාසි යටතේ, වියදම් වාර්තා කොට, ආයතනයේ ආදායම පවත්වා ගෙන යෑමේ කාර්යභාරය ඉටුකරයි.

- ස්ථාවර වත්කම් ලේඛනයේ 95%ක් සම්පූර්ණ කොට සකසා ඇත.
- 2019 වර්ෂය සඳහා - සමීක්ෂණ කාර්යය නිමාකොට ඇත.
- 2019 වර්ෂය සඳහා, විගණකාධිපති වෙත, අවසාන මූල්‍ය තත්ව ප්‍රකාශනය සකසා ඉදිරිපත් කොට ඇත.
- අබලි භාණ්ඩ ඉවත් කිරීමේ ක්‍රියාදාමයට අදාළ වැඩ කොටසින් 90%ක් නිමා කොට ඇත.
- ටෙන්ඩර් මණ්ඩලයට අදාළ වැඩ කොටසින් 90%ක් සම්පූර්ණ කොට ඇත.
- ප්‍රාග්ධන භාණ්ඩ සහ ලිපි ද්‍රව්‍ය මිලට ගැනීමේ කාර්යය 50%ක් සම්පූර්ණ කොට ඇත.

8.3 ඉංජිනේරු සේවා සහ නඩත්තු දෙපාර්තමේන්තුව

ඉංජිනේරු සේවා සහ නඩත්තු දෙපාර්තමේන්තුව, අධ්‍යයන වැඩ කටයුතුවලට සුදුසු භෞතික වටපිටාවක් පවත්වා ගැනීම, ආයතනයේ ගොඩනැගිලි පවත්වා ගෙන යෑම, විදුලිය සහ ටෙලිෆෝන් සේවා පවත්වා ගෙන යෑම, පිරිසිදු කිරීම්, ආරක්ෂක සේවා ආදිය සහ සම්බන්ධතාව පවත්වා ගෙන යෑම සහ යටිතල පහසුකම් සැපයීම ආදිය පිළිබඳ වගකීම් දරයි.

2020 වර්ෂයට අදාළ පහත සඳහන් කාර්ය භාරයන් ඉංජිනේරු සේවා විසින් නිමා කොට ඇත.

- මීපේ පරිපථයේ නේවාසිකාගාර සංකීර්ණය ඉදිකිරීමේ කාර්යයන් 70% නිමා කොට ඇත.
- මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා නේවාසික ගොඩනැගිල්ල ඉදිකිරීමේ කාර්යයෙන් 70%ක් නිමා කොට ඇත.
- මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා නේවාසික ගොඩනැගිල්ල ඉදිකිරීමේ කාර්යයෙන් 70%ක් නිමා කොට ඇත.
- ජාතික අධ්‍යාපන ආයතනයේ පස් මහල් ශ්‍රවණ ශාලා ගොඩනැගිලි සංකීර්ණයට අදාළ සිවිල් වැඩ කොටසින් 80%ක් නිමා කොට ඇත.
- ගොඩනැගිලි සහ ව්‍යුහාත්මක කාර්යයට අදාළ පුනරුත්ථාපන කාර්යය විසිතුනෙන්, විස්සක් සම්පූර්ණ කොට ඇති අතර, දෙකක් කෙරෙමින් පවතී.

8.5 මුද්‍රණ සහ ප්‍රකාශන

2020 වර්ෂය තුළ පහත සඳහන් ආයතන ප්‍රකාශන, මුද්‍රණ සහ ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කොට ඇත.

- ගුරු මාර්ගෝපදේශ - 06
- සම්පත් ද්‍රව්‍ය - 46
- සහතික - 15
- ලිපිගොනු කවර - 01
- වෙනත් දෑ - 46

ඉහත සඳහන් දෙයට අමතරව, එක් පොත් ප්‍රදර්ශනයට සහභාගි වී ඇති අතර, විෂයමාලා සංවර්ධනයට අදාළව, ජාතික අධ්‍යාපන ආයතන ප්‍රකාශන සහ ලේඛන ප්‍රසිද්ධ කිරීමේ අවස්ථාව ද ලබා ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HED/A/NIE/FA/2020 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2021 දෙසැම්බර් 16 දින

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

ජාතික අධ්‍යාපන ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික අධ්‍යාපන ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 54 ඡේදයට පටහැනිව 2018 දෙසැම්බර් 31 දින සිදුකරන ලද වත්කම් ප්‍රත්‍යාගණනයේදී පරිගණක උපාංග හා කාර්යාල උපකරණ ප්‍රත්‍යාගණන අලාභ පිළිවෙලින් රු.මිලියන 44.2 ක් හා රු.මිලියන 20.6 ක් වෙනත් වත්කම් පන්ති 04 ක ප්‍රත්‍යාගණන අතිරික්තයකට හිලව් කර තිබුණි. එම හේතුවෙන් ප්‍රත්‍යාගණන අතිරික්තය හා සමුච්චිත අරමුදල පිළිවෙලින් රු.මිලියන 64.8 බැගින් අඩුවෙන් හා වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි.

(ආ) ආයතනයේ පවත්වාගෙන යනු ලබන පාඨමාලා 16ක් අතුරින් විගණන පරීක්ෂාවට ලක් කරන ලද පාඨමාලා 02 කට අදාළව ඉදිරි වර්ෂය සඳහා ලැබී තිබූ පාඨමාලා ගාස්තු ආදායම රු.මිලියන 3.3ක් සමාලෝචිත වර්ෂයේ පාඨමාලා ගාස්තු ලෙස හඳුනාගැනීම හේතුවෙන් වර්ෂයේ පාඨමාලා ගාස්තු ආදායම හා ඉදිරියට ලැබූ පාඨමාලා ගාස්තු ආදායම පිළිවෙලින් එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) මුදල් ප්‍රවාහයක් නොවන රු.මිලියන 15.1 ක් වූ වත්කම් ප්‍රත්‍යාගණන අතිරික්තය හා බැඳුම්කර කඩවීමේ අරමුදලින් සමුච්චිත අරමුදලට මාරු කර තිබූ රු.මිලියන 7.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පිළිවෙළින් මුදල් ගලා ඒමක් සහ මුදල් ගලා යාමක් ලෙස ඇතුළත් කර තිබුණි.

(ඈ) බැඳුම්කර ගිවිසුම් කඩකල නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල් සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබූ අතර සමාලෝචිත වර්ෂය ආරම්භයේ බැඳුම්කර කඩවීම් අරමුදලෙහි පැවති රු. මිලියන 7.2 ක මුදල සමුච්චිත අරමුදලට මාරුකර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන

වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කරනු ලැබේ. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක්

ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වසරේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සමාජිකයෙකුට ආයතනයට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 396	නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 6 ඉක්ම වූ එකතු වටිනාකම රු. 8,216,857 ක් වූ චෙක්පත් 44 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කාර්තව්‍ය හා කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාලසීමාවන් තුල අදාළ නිතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලයට අදාළව ගෙවිය යුතු හිඟ අර්ථසාධක හා අධිභාර මුදල වූ රු.68,757,865 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට නිරවුල් කර නොතිබුණි.

(ආ) 2020 වර්ෂයේ COVID-19 තත්ත්වය තුළ පාසල් අධ්‍යාපනයේ ඇති වූ බාධාවන් මගහරවා ගැනීම උදෙසා ගුරුගෙදර වැනි රූපවාහිනී හා වෙනත් වැඩසටහන් මෙහෙයවීම වෙනුවෙන් අමාත්‍යාංශය හා වෙනත් සංවිධාන විසින් රු.155,106,221 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ආයතනයට ලබා දී තිබුණි. ඉන් රු.119,678,677 ක් අදාළ අරමුණට පරිබාහිර කටයුතු වෙනුවෙන් වැය කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

ජාතික අධ්‍යාපන ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට අදාළ පැහැදිලි කිරීම් වාර්තාව

1.2 **තත්ත්වාගණනය කල මතය සඳහා පදනම**

(අ) 2018 වර්ෂයේ ජාතික අධ්‍යාපන ආයතනය විසින් පිළියෙල කර තිබූ ස්ථාවර වත්කම් ලේඛනයේ පරිගණක උපාංග යන වත්කම් පන්තිය යටතේ තිබූ අයිතම කිහිපයක් ප්‍රත්‍යාගණනය කිරීමේදී කාර්යාල උපකරණ ලෙස හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කර කාර්යාල උපකරණ යන වත්කම් පන්තියට ඇතුළත් කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව වත්කම් පන්තීන් දෙක අතර ප්‍රත්‍යාගණන අගය අඩු හෝ වැඩි වීම හිලව් නොකළ යුතු වුවත් මෙම අවස්ථාවේ දී එම වත්කම් පන්තීන් දෙක වෙන වෙනම ප්‍රත්‍යාගණන අතිරික්තය හෝ ඌනතාවය සෙවීම දෝෂ සහගත වේ. මන්ද කලින් පරිගණක උපාංග යන වත්කම් පන්තියේ තිබූ අයිතමවලින් කොටසක් ප්‍රත්‍යාගණනයෙන් පසු කාර්යාලීය උපකරණ වත්කම් පන්තිය තුළට ඇතුළත් කර ඇති බැවිනි. එබැවින් සත්‍ය වශයෙන් ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් පන්තිවල අගයන් මත අතිරික්තය හෝ ඌනතාවය ගැලපීම නිසා මෙය දෝෂ සහිත නොවේ.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

2021 වර්ෂයේ ගිණුම් පිළියෙළ කිරීමේ දී අදාළ උපලේඛන මඟින් මෙම ගැටලුව නිරාකරණය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

(ආ) ආයතනය විසින් 2020 වර්ෂයට සැලසුම් කරන ලද පාඨමාලා ගාස්තු ආදායම එම වර්ෂයට අදාළ බැවින් මෙසේ ගිණුම්ගත කර ඇත. ඉදිරියේ දී මෙම පාඨමාලා ගාස්තු ලබා ගැනීමේ දී ඉහත පරිදි ගැටලු ඇති නොවන පරිදි කටයුතු කිරීමට දැනටමත් පාඨමාලා සම්බන්ධීකරණ නිලධාරීන් සමඟ සාකච්ඡා කොට අදාළ පියවර ගෙන ඇත.

පාඨමාලා ගාස්තු ආදායම නිවැරදිව හඳුනා ගැනීම සඳහා ක්‍රමවේදයන් දැනටමත් සකස් කර තිබේ.

උදා - අධ්‍යාපනවේදී (විශේෂ) උපාධි පාඨමාලාව -2022/2025 අධ්‍යයන වර්ෂයට අදාළ අයදුම්පත් කැඳවීම සඳහා වන දැන්වීමේ පිටපතක් මේ සමඟ ඉදිරිපත් කර ඇත. (ඇමුණුම 01).

මෙහි අනු අංක 6.2.8 හා 6.2.9 මඟින් මෙම ක්‍රමවේදය ක්‍රියාවට නංවා ඇත.

පාඨමාලා ගාස්තු අය කිරීම සඳහා ලංකා බැංකුව සහ මහජන බැංකුව සමඟ ගෙවීම් ක්‍රමයක් සකසා ඇත. ඉදිරියේ දී මෙවැනි වැරදි සිදු නොවී නියමිත කාල වකවානුව සඳහා පාඨමාලා ගාස්තු හඳුනා ගැනීමට කටයුතු කරනු ලැබේ.

පාඨමාලා ගාස්තු ගෙවනු ලබන පාඨමාලාලාභීන් දැනට පවතින ක්‍රමය අනුව හඳුනාගැනීමට අසීරුතාවයක් පවතින බැවින් ලංකා බැංකුව සමඟ සම්බන්ධීකරණය වී T4S පැනල් පහසුකම ලබා ගෙන ඇති අතර Payment Gateway පහසුකම ලබා ගැනීම සඳහා දැනටමත් අවශ්‍ය කටයුතු කරගෙන යනු ලැබේ.

මහජන බැංකුව සමඟ Payment Gateway පහසුකම දැනටමත් ආරම්භ කර ඇත.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

2022 ගිණුම් වර්ෂයේ දී මෙවැනි අඩුපාඩු මඟ හරවා ගැනීමට කටයුතු කල යුතු බව.

(ඇ) ඉදිරි ගිණුම් වර්ෂවලදී මෙවැනි වැරදි ඇති නොවන පරිදි කටයුතු කරනු ලැබේ.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

ගිණුම් අංශයේ කටයුතු සම්බන්ධයෙන් නිසි සුපරීක්ෂණයක් අධ්‍යක්ෂ (මුදල්), නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්), සහකාර අධ්‍යක්ෂ (මුදල්) විසින් සිදු කිරීම.

(ඈ) බැඳුම්කර කඩවීමෙන් ලැබූ මුදල් ආයතනයේ ආදායමක් ලෙස හඳුනාගෙන ඇති බැවින් එය අදාළ වර්ෂයට අයත් ආදායමක් නොවන බැවින් සමුච්චිත අරමුදලට බැර කරන ලදී. තව ද මෙවැනි අවස්ථාවක දී කටයුතු කරන ආකාරය පිළිබඳ අදාළ ආයතන වෙතින් විමසීමෙන් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනා ගැනීමට කටයුතු කරනු ලැබේ.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අනුගමනය කරනු ලබන බැඳුම්කර කඩවීම් ගිණුම්ගත කරනු ලබන ක්‍රමවේදය අදාළ කරගනිමින් මේ සඳහා ගිණුම් තැබීමේ ක්‍රමවේදයක් ජාතික අධ්‍යාපන ආයතනය සඳහා සකස් කර එයට ආයතන සභාවේ අනුමැතිය ලබා ගැනීම පිණිස ආයතන සභා පත්‍රිකාවක් යොමු කිරීමටත්, එහි දී ලබා දෙන තීරණය පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහයට සංශෝධනයක් ලෙස ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු බව.

2023 ජනවාරි 01 සිට මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.2.2 **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**
මුදල් රෙගුලාසි 396

මීට අදාළව යොමු කර තිබූ විගණන විමසුමේ සඳහන් චෙක්පත් 98හි වටිනාකම රු. 8,656,037/- ලෙස සඳහන් වුව ද එහි නිවැරදි වටිනාකම රු. 856,037/50 විය යුතුය.

එම චෙක්පත් 98 න් චෙක්පත් 32 ක් නිෂ්කාශනය වී ඇත. තවත් චෙක්පත් 4 ක් අවලංගු කර නව චෙක්පත් නිකුත් කර ඒවා ද නිෂ්කාශනය වී ඇත. ඉතිරි චෙක්පත් 62 අවලංගු කර ආදායමට ගෙන ඇත (ජ'නල් සටහන් අංක 58). අදාළ විස්තර ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කර ඇත.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

විගණන වාර්තාවේ චෙක්පත් 44 හි වටිනාකම රු. 8,216,857/- ක් ලෙස දක්වා ඇති අතර කළමනාකරණයේ පැහැදිලි කිරීම් අනුව මීට අදාළව යොමු කර තිබූ විගණන විමසුමේ සඳහන් චෙක්පත් 98 හි වටිනාකම රු.856,037/50 වන බැවින් විගණන වාර්තාවේ සඳහන් මෙම මුදල සංශෝධනය විය යුතුව ඇති බව සාකච්ඡා විය.

මේ සඳහා විගණන අධිකාරී එකඟ වූ අතර ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී.

මීට අදාළව කළමනාකරණය මඟින් ගත් ක්‍රියා මාර්ගය

විගණන සහ කළමනාකරණ කමිටුවේ නිර්දේශ අනුව පහත පැහැදිලි කිරීම ද සහිතව 2022.03.29 දින විගණකාධිපති වෙත ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කරන ලදී.

එම ලිපියේ චෙක්පත් 44ක් හා එහි වටිනාකම රු. 8,216,857/- ක් ලෙස වාර්තාවේ දැක්වුව ද විගණිත දිනයේ පැවති ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් සංඛ්‍යාව 43 ක් හා ඒවායේ වටිනාකම රු. 416,404/50 ක් බවත්,

තවද, මාස 6 ඉක්මවා ඇති චෙක්පත් සංඛ්‍යාව 4 ක්වන අතර ඒවායේ වටිනාකම රු. 37,492/- ක් බවත් සඳහන් කර ඇත (ඇමුණුම 03).

ඒ අනුව, මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොමැති රු. 37,492/- ක් වන චෙක්පත් 4 ක් පමණක් 2020 මූල්‍ය වර්ෂය අවසානයට නිබී ඇත.

ඇමුණුම් අංක 03 හි අනු අංක 40 – 43 හි සඳහන් කර ඇති චෙක්පත් 4 න් 3ක් අවලංගු කර ආදායමට ගෙන ඇති අතර ඉතිරි චෙක්පත (චෙක්පත් අංක 509935) අවලංගු කර නව චෙක්පතක් නිකුත් කර ඇත. නව චෙක්පත 2021.09.15 දින නිෂ්කාශනය වී ඇත.

2.3 **වෙනත් කරුණු**

(අ) හිඟ සේවක අර්ථසාධක අරමුදල් දැනට ගෙවා ඇති ආකාරය පහත පරිදිය.

චෙක්පත් අංකය	කාල සීමාව	මුදල රු.
377039	2006.01.01 - 2009.12.31	7,100,954.00
376958	2010.01.01 - 2015.02.28 2006.01.01 - 2015.02.28	12,740,501.55
377201	2010.01.01 - 2013.02.28	7,000,429.63
නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ ගෙවා ඇති මුදල		160,992.50
මේ දක්වා ගෙවා ඇති මුදල		**27,002,877.68**

දැනට ගෙවන ලද මුදල්වලට අමතරව හිඟ EPF මුදල හා අධිභාර මුදල ආයතනික ඉපයීම් මුදල් වලින් වසර 2ක් තුල ගෙවා දැමීම සඳහා අනුමැතිය ලබා ගැනීමට 2022.02.28 දින පැවති ආයතන සභාව වෙත යොමු කර ඇත.

කම්කරු දෙපාර්තමේන්තුව මඟින් 2022.10.25 දිනැතිව යොමු කර ඇති ලිපිය අනුව අධිභාර මුදල සම්පූර්ණයෙන්ම නිදහස් කර ඇත (ඇමුණුම 04). මේ අනුව ඉතිරි මුදල ගෙවීමට කටයුතු කරමින් පවතී.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

ඉහත පිළිතුර සමඟ කමිටුව එකඟවන ලදී.

(ආ) විගණන වාර්තාවේ කොවිඩ්- 19 තත්ත්වය තුළ පාසල් අධ්‍යාපනයේ ඇති වූ බාධාවන් මඟහරවා ගැනීම උදෙසා ගුරු ගෙදර වැනි රූපවාහිනී හා වෙනත් වැඩසටහන් මෙහෙයවීම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය හා වෙනත් සංවිධාන විසින් රු. 155,106,221/- ක මුදලක් ලබා දී ඇති බව සඳහන් වීම පිළිගත නොහැක.

මෙම රු.155,106,220/75 ක මුදල ජාතික අධ්‍යාපන ආයතනයට එහි සාමාන්‍ය කාර්යභාරයන් ඉටු කිරීම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් හා වෙනත් ආයතන වෙතින් 2020 වර්ෂයේ ලද සමස්ත මුදල වේ. එය පහත පරිදි වේ.

රු.

GEMP	130,000,000/-
UNICEF	5,885,000/-
KOREAN/ CANADA	6,403,220/75
Local MOE	12,818,000/-
	155,106,220/75

2020 වසරේ රට තුළ පැවති කොවිඩ්- 19 ව්‍යසන තත්ත්වය මත පාසල් දරු දැරියන් වෙනුවෙන් ගුරු ගෙදර රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන කාර්යය භාරය ජාතික අධ්‍යාපන ආයතනය වෙත පැවරුණි. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන GEMP ව්‍යාපෘතිය යටතේ ලබා දුන් මුදලින් වියදම් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අනුමැතිය ලැබුණි.

ඒ අනුව GEMP ව්‍යාපෘතිය යටතේ ලද රු. 130,000,000/- මුදලින් GEMP ව්‍යාපෘතියේ කටයුතු සඳහා රු. 19,088,114/45 මුදලක් ද, ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රු. 13,713,912/- මුදලක් ද වැයකර ඇත. ඉතිරි වූ රු. 97,197,973/55 මුදල අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතිය අනුව ගුරු ගෙදර අධ්‍යාපනික වැඩසටහන් සඳහා භාවිතයට ගන්නා ලදී. එ් අනුව රු. 82,191,275/56 මුදලක් වියදම් දරා තිබූ අතර ගුරු ගෙදර වැඩසටහන් සඳහා තව දුරටත් ගෙවිය යුතුව පැවති වියදම් වෙනුවෙන් රු.15,006,697/99 මුදල ව්‍යාපෘති අරමුදලින් භාවිතයට ගැනුණි.

අනෙකුත් ව්‍යාපෘති සඳහා ලද මුදලින් වර්ෂයේ වියදම් කිරීමෙන් අනතුරුව ඉතිරි වූ මුදල රු.8,766,792/48 කි. එය පහත පරිදි වේ.

	ප්‍රතිපාදන රු.	වියදම් කල ප්‍රමාණය රු.	ඉතිරි ප්‍රමාණය රු.
UNICEF	5,885,000.00	963,025.00	4,921,975.00
KOREAN/ CANADA	6,403,220.75	4,076,579.00	2,326,641.75
Local MOE	12,818,000.00	11,299,824.27	1,518,175.73
	25,106,220.75	16,339,428.27	8,766,792.48

ඉහත ව්‍යාපෘතිවලින් ඉතිරි වූ රු. 8,766,792/48 ක මුදල 2021 වර්ෂයේ වියදම් දැරීම සඳහා ඒ ඒ ව්‍යාපෘති යටතේ ඉදිරියට ගෙන ගොස් ඇත.

ඉහත තොරතුරු අනුව රු. 119,678,677/- මුදල අදාළ අරමුණට පරිබාහිර කටයුතු වෙනුවෙන් වියදම් කර නොමැති බව සඳහන් කරනු කැමැත්තෙමි.

ගුරු ගෙදර රූපවාහිනී වැඩ සටහන් සිදු කලේ රට තුළ ඇදිරි නීතිය දමා තිබූ, රට වසා තිබූ, ප්‍රවාහන පහසුකම් නොතිබුණ කිසිදු දරුවෙකු පාසලකට නොගිය, නිලධාරීන් රැකියාවට පැමිණීමට අකමැති, ජීවිත අවධානමක් පැවති කාලයකය. එම නිසා භාර දුන් රූපවාහිනී වැඩසටහන් 9000 ක් භාෂා 03 න්ම නිෂ්පාදනය කල අතර ඒ අනුව සේවයට පැමිණි කාර්ය මණ්ඩලයට ආහාර පාන, නේවාසික පහසුකම් හා ප්‍රවාහන පහසුකම් ලබා දීමට සිදු විය.

ගුරු ගෙදර රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදනය කිරීමට අදාළ කැබිනට් තීරණය අනුව දිනපතාම පැය 13 ක් රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදනය කිරීම සිදු කළ යුතුව තිබුණි. මීට අදාළ පටිගත කිරීම් මධ්‍යස්ථාන 06 ක සිදු කල අතර උදේ 5.00 සිට රාත්‍රී 12.00 දක්වා ජීවිත අවධානම නොතකා කාර්ය මණ්ඩලය සේවය කරන ලදී.

ගුවන් හමුදාපති මඟින් ලබා දුන් විශේෂ අවසරයක් මත යාපනයේ චිත්‍රාගාරයක දී කරන ලද පටිගත කිරීම් ගුවන් හමුදාව මඟින් අප වෙත ලබා දුන් අතර, කොවිඩ් රෝගීන් ප්‍රවාහනය කරන ලද ගිලන් රථවල පවා අදාළ පටිගත කරන ලද තැටි රැගෙන ආ විට, අපගේ රියදුරු මහතුන් ජීවිත අවධානම නොතකා එම වීඩියෝ පට I.D.H.රෝහල වෙත ගොස් රැගෙන එන ලදී.

ජාතික අධ්‍යාපන ආයතනයේම කොටසක් නිරෝධායන මධ්‍යස්ථානයක් ලෙස ද පවත්වාගෙන ගිය අතර ගුරු ගෙදර වැඩසටහන් පටිගත කිරීම් සඳහා පැමිණි ගුරුවරුන් කොවිඩ් රෝගීන් බවට දන්වා සිටින විට ආයතනයේ නිලධාරීන් නිරෝධායනයට ලක්කර , ඔවුන් සඳහා ආහාර පාන, නේවාසික පහසුකම් ලබා දීමට සිදු විය.

කොවිඩ් - 19 වසංගතය හමුවේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් ඉතා ඉක්මනින් ප්‍රතිචාර දැක්වූ රටක් ලෙස ශ්‍රී ලංකාව ද ඉදිරියෙන් සිටින බව UNESCO සංවිධානය මඟින් දන්වා තිබූ අතර මෙය සාමූහික වගකීමක් ලෙස සිදු කල විශාල කර්තව්‍යයකි.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

මෙහි සඳහන් කරුණු සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලද අතර ජාතික අධ්‍යාපන ආයතනය විසින් ලබා දී ඇති තොරතුරු හා විගණනය සඳහා ඉල්ලා ඇති තොරතුරු සම්බන්ධයෙන් නිවැරදිව අදහස් හුවමාරුවක් සිදුව නොමැති බව නිරීක්ෂණය විය.

තව ද කොවිඩ් - 19 තත්ත්වය හමුවේ ආයතනයේ නිලධාරීන් දුර බැහැර සිට රාජකාරීවලට ගෙන්වීමට අවශ්‍ය වීම හා දිවා රෑ අදාළ කාර්යයේ නියැලීමට සිදුවීම ආදි කරුණු හේතුවෙන් එම කාර්යයට අදාළව වැය කරන ලද සියලුම මුදල් මෙහි ඇතුළත් කර ඇති බව නිරීක්ෂණය විය. (උදා - අතිකාල, ගමන් වියදම්, ලිපි ද්‍රව්‍ය යනාදිය)

එම නිසා කොවිඩ් - 19 තත්ත්වය පැවති වකවානුවේ ගුරු ගෙදර වැඩසටහන මෙහෙයවීමට වැය කළ මුදල සැලකීමේ දී ඊට ආනුශංගික අනෙකුත් වියදම් ද ඇතුළත් කළ යුතුය. එම නිසා, විගණනය ඉල්ලූ විට නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීම ආයතනයේ වගකීම වන අතර විගණන කාර්යාලය වෙත තොරතුරු ලබා දීමේ දී නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සන සහිතව තොරතුරු ලබා දීමට පියවර ගත යුතුවේ.

වාර්ෂික වාර්තාවට මෙම ඡේදය ඇතුළත් වීම තුළින් ඒ හරහා අකටයුත්තක් හෝ විශාල දූෂණයක් සිදු වී ඇති බව ගම්‍ය වන හෙයින් නිවැරදි තොරතුරු ඉදිරිපත් කර මෙම ඡේදය වාර්තාවෙන් ඉවත්කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු ය.

මීට අදාළව කළමනාකරණය මඟින් ගත් ඉදිරි ක්‍රියා මාර්ගය

විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශය අනුව පහත පැහැදිලි කිරීම් ද සහිතව 2022.03.29 දින විගණකාධිපති වෙත ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කරන ලදී.

2020 වර්ෂයේ ඇතිවූ කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඩාල නොවී පවත්වාගෙන යාම සඳහා ගුරුගෙදර වැඩසටහන ආරම්භ කළ අතර එම වසංගත තත්ත්වයද නොසලකා ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන් විශාල කැපකිරීමක් සිදු කරමින් දුර බැහැර ප්‍රදේශවල සිට පැමිණ එම අධ්‍යාපන වැඩසටහන් සකස් කිරීමේ කටයුතුවල නියැලෙන ලදී.

ජාතික අධ්‍යාපන ආයතනයේ කටයුතු වෙනුවෙන් වූ වියදම ආයතනයේ ආදායම, මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රදාන හා අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින්, ව්‍යාපෘති හරහා හා වෙනත් ආයතන මගින් ලැබෙන මුදල් මගින් දරනු ලැබේ. ඒ අනුව, 2020 වසර සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය හා අනෙකුත් ආයතන මගින් ලැබුණ සම්පූර්ණ මුදල රු.155,106,220/75 ක් වන අතර එම සම්පූර්ණ මුදල ගුරුගෙදර වියදම් පියවීමට භාවිතා කර නොමැත.

(විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද විස්තර ඇතුළත් ඇමුණුම, ඇමුණුම් අංක 05 මඟින් ඉදිරිපත් කර ඇත).

සංශෝධිත අයවැය ලේඛනය අනුව, ගුරුගෙදර වැඩසටහන් මෙහෙයවීම වෙනුවෙන් වෙන්වූ ප්‍රතිපාදනය රු.150,651,000/- ක් වන අතර 2020.12.31 දිනට වැයකර ඇති මුදල රු. 97,197,973/55 ක් වේ. ඒ අනුව, ගුරුගෙදර වැඩසටහනින් පරිබාහිර කටයුතු වෙනුවෙන් රු. 119,678,677/- ක් වැයකර ඇති බවට විගණන වාර්තාවල දක්වා තිබීම නිවැරදි නොවන අතර එවැනි විශාල මුදලක් වෙනත් කටයුතු වෙනුවෙන් වැයකර ඇති බව විගණන වාර්තාවේ සඳහන් කිරීම හරහා ආයතනය වංචාවක් සිදු කර ඇති බවක් ගම්‍ය වන බව එම ලිපිය මඟින් විගණකාධිපති වෙත දැනුම් දී ඇත.

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික අධ්‍යාපන ආයතනය

අධ්‍යාපනවේදී (විශේෂ) උපාධි පාඨමාලාව 2022/2025

ජාතික අධ්‍යාපන ආයතනය මගින් පවත්වනු ලබන අධ්‍යාපනවේදී (විශේෂ) උපාධි පාඨමාලාව (2022/2025) සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

1. පාඨමාලාවේ ස්වභාවය

1.1 අධ්‍යාපනවේදී (විශේෂ) උපාධි පාඨමාලාව සම්භාර 120 කින් යුක්තය. ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් සඳහා පමණක් පාඨමාලා සම්භාර 40 ක් නිදහස් කෙරේ.

1.2 සම්මිශ්‍රිත ක්‍රමය අනුව (Blended Learning) මාර්ගගතව හා සම්මුඛ සැසි මගින් පවත්වනු ලබන පාඨමාලාවකි.

1.3 සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පාඨමාලාව පවත්වන අතර ඉංග්‍රීසි විෂය ධාරාව පමණක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

1.4 ශාස්ත්‍රීය විෂය බණ්ඩය යටතේ ඔබ විසින් පහත දැක්වෙන විෂය ධාරාවන්ගෙන් එකක් තෝරා ගත යුතු වේ.

විෂය අංකය	විෂයය ධාරාව	විෂය අංකය	විෂයය ධාරාව
01	ප්‍රාථමික	08	ගෘහ ආර්ථික විද්‍යාව
02	ගණිතය	09	සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය
03	විද්‍යාව	10	ශිල්ප කලා
04	වාණිජ්‍යය	11	විශේෂ අධ්‍යාපනය
05	සමාජීය විද්‍යා	12	තොරතුරු තාක්ෂණය
06	ඉංග්‍රීසි	13	දෙවන භාෂාව සිංහල/දෙමළ
07	කෘෂිකර්මය	14	සෞන්දර්ය අධ්‍යාපනය

2. අයදුම් කිරීම සඳහා ප්‍රවේශ සුදුසුකම්

2.1 අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම හෝ,

2.2 රජයේ ගුරු විද්‍යාල ප්‍රහුණු සහතික පත්‍රය හෝ,

2.3 ජාතික අධ්‍යාපන ආයතනයේ දුරස්ථ ගුරු ප්‍රහුණු සහතික පත්‍රය හෝ,

2.4 උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ උසස් ජාතික ඩිප්ලෝමාව හෝ,

2.5 ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ,

2.6 ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාව පිළිගත් වෙනත් සුදුසුකම්

සහ

2.7 2021.11.01 දිනට හෝ එදිනට පෙර ශ්‍රී ලංකා ගුරු සේවයේ/ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ/ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවයේ/ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ/ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ස්ථිර පත්වීමක් ලබා තිබීම.

සහ

2.8 ස්ථිර පත්වීම ලබා ගැනීමෙන් අනතුරුව 2021.11.01 දිනය වන විටත් අඛණ්ඩව සේවයේ නිරතව සිටීම.

3. ගාස්තු අය කිරීම

අයදුම්පත්‍ර ගාස්තුව (ප්‍රවේශ විභාග ගාස්තුව ඇතුළත්ය)	රු: 1,500/=
ලියාපදිංචි ගාස්තුව	රු: 2,000/=
අධ්‍යාපනවේදී (විශේෂ) උපාධි පාඨමාලා ගාස්තුව	රු: 150,000/=

පාඨමාලා ගාස්තු සමාන වාරික දෙකකින් ගෙවිය හැකිය. විභාගයට් ඉල්ලුම් කරන අවස්ථාවේ දී අදාළ විභාග ගාස්තු ගෙවිය යුතුය. ගාස්තු සංශෝධනය කිරීමට ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවට බලය ඇත.

4. පාඨමාලාව පැවැත්වෙන මධ්‍යස්ථාන

පාඨමාලාව පැවැත්වෙන මධ්‍යස්ථාන විෂයධාරා අංකය සහ මාධ්‍යය අනුව වෙන් කර පහත දක්වා ඇත. එයින් තමා කැමති මධ්‍යස්ථාන දෙකක් තෝරා ගත හැකිය.

ඒ ඒ විෂයධාරාව පවත්වන මධ්‍යස්ථාන හා ශිෂ්‍ය සංඛ්‍යාව තීරණය කිරීමේ බලය ජාතික අධ්‍යාපන ආයතනය සතුවේ.

අනු අංකය	මධ්‍යස්ථානය	විෂය ධාරා අංක (වගුව 1.4 බලන්න)	මාධ්‍යය		
			සිංහල	දෙමළ	ඉංග්‍රීසි
01	කොළඹ	01, 02, 03, 04, 05, 06, 07, 08, 09, 10, 11, 12, 13, 14	√	√	√
02	ගම්පහ	01, 02, 03, 05	√		
03	කළුතර	01, 05, 06	√		√
04	මහනුවර	01, 02, 03, 04, 05, 06, 07, 09, 10	√	√	√
05	මාතලේ	01, 02, 05	√	√	
06	නුවරඑළිය	01, 02, 03, 04, 05, 06	√	√	√
07	ත්‍රිකුණාමලය	01, 05	√	√	
08	අම්පාර	01, 02, 03, 04, 05	√	√	
09	මඩකලපුව	01, 05, 14		√	
10	යාපනය	01, 02, 03, 04, 05, 06		√	√
11	මන්නාරම	01, 05,		√	
12	කිලිනොච්චිය	01, 05,		√	
13	වවුනියාව	01, 05		√	
14	මුලතිව්	01, 05,		√	
15	අනුරාධපුරය	01, 05, 06, 07	√		√
16	පොළොන්නරුව	01, 05	√		
17	කුරුණෑගල	01, 05, 06, 08	√		√
18	පුත්තලම	01, 05	√	√	
19	රත්නපුරය	01, 05, 12	√	√	
20	කෑගල්ල	01, 05,	√	√	
21	ගාල්ල	01, 03, 05,	√		
22	මාතර	01, 02, 05,	√		
23	හම්බන්තොට	01, 05	√		
24	බදුල්ල	01, 05, 06	√	√	√
25	මොණරාගල	01, 05	√		

5. තෝරා ගැනීම

පාඨමාලාව සඳහා තෝරා ගනු ලබන්නේ ලිඛිත පරීක්ෂණයක හා සම්මුඛ පරීක්ෂණයක හෝ සම්මුඛ පරීක්ෂණයක පමණක් ප්‍රතිඵල මතය. ලිඛිත පරීක්ෂණය පැවැත්වෙන්නේ නම් එය "අභියෝග්‍යතාව හා අධ්‍යාපනය පිළිබඳ සාමාන්‍ය දැනීම" සම්බන්ධ පරීක්ෂණයකි. එබඳු අවස්ථාවක ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අයදුම්කරුවන් විසින් වැරදි ලේඛන හෝ තොරතුරු ඉදිරිපත් කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි.

6. අයදුම්පත් යොමු කළ යුතු ආකාරය

6.1 ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් පාඨමාලාවට අයදුම්පත් කැඳවීම සම්බන්ධ තොරතුරු ලබා හැකිය. https://www.exams.nie.lk/intakes/new

6.2 මාර්ගගත ක්‍රමයට අයදුම්පත් යොමු කිරීමේ දී පහත සඳහන් ක්‍රියාපිළිවෙල අනුගමනය කරන්න.

6.2.1 https://www.exams.nie.lk/intakes/new වෙබ් අඩවියට ඇතුළත් වී (Sign up) අදාළ තොරතුරු සම්පූර්ණ කරන්න. එහි දී ඔබට ලැබෙන පරිශීලක අංකය (User ID) සටහන් කර ගන්න. අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා මුරපදය (Password) මතක තබා ගන්න.

6.2.2 වෙබ් අඩවියේ දකුණු පස ඉහළ දැක්වෙන කොටු දෙකෙහි පරිශීලක අංකය හා මුරපදය යොදා ඇතුළත් වන්න. (Log in)

6.2.3 ඔබ පිළිබඳ තොරතුරු පත්‍රිකාව (User Profile) යාවත්කාලීන (Update) කරන්න.

- පෞද්ගලික තොරතුරු
- සේවා තොරතුරු
- අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

6.2.4 අනතුරුව නව ප්‍රවේශ (New Enrollment) වෙත පිවිසෙන්න.

6.2.5 ඊළඟට ඔබට නියමිත පාඨමාලාවේ අයදුම්පත්‍රයට ප්‍රවේශ වන්න. (My Application)

6.2.6 අයදුම්පත්‍රයේ දක්වා ඇති තොරතුරු නිවැරදි දැයි පරීක්ෂා කරන්න.

6.2.7 එහි අයිතම අංක 06 යටතේ පාඨමාලාව පැවැත්වෙන මධ්‍යස්ථානය මාධ්‍යය හා විෂයධාරාව තෝරා අයදුම්පත්‍රය **යොමු කරන්න**.

6.2.8 අදියර 2 හි **ගෙවීම්** (STEP 2 Payment) සඳහා ප්‍රවේශ වන්න. **මෙහි දී ඔබ වෙත ලැබෙන ගෙවීම්** යොමු අංකය (Payment Reference Number) යොදා දක්වා ඇති ගිණුමට මුදල් ගෙවන්න. (ලංකා බැංකු ශාඛාවකින් මහරගම ශාඛාවේ, ජාතික අධ්‍යාපන ආයතනයේ, අධ්‍යක්ෂ ජනරාල්ගේ ගිණුම් අංක 607628 දරණ ගිණුමට අයදුම්පත්‍ර ගාස්තු වශයෙන් රු: 1500/- ක මුදලක් බැර කරන්න.)

6.2.9 මුදල් ගෙවන ලද රිසිට් පත ස්කෑන් කර ගෙවීම් දිනය හා ගණුදෙනු යොමු අංකය (Transaction Reference Number) ඇතුළත් කරන්න.

6.2.10 ඔබට ලැබෙන අයදුම්පත් පරිශීලක අංකය (Application Reference Number) සටහන් කර තබා ගන්න.

6.3 වැඩිදුර විස්තර සඳහා 0117601777/0117601776/0117601755 දුරකථන අංකවලට සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා අමතන්න.

අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2021.11.25

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

ExSys

User ID Password

Forgot your User ID or Password

INTAKES

New Enrollments



« Home | « Programmes | Active Intakes | Past Intakes | Examinations »

Code	Name of the Programme	Year	Total ❶	Resour
BS22	Bachelor of Education (Special) Degree (BEdSpecial) [Syllabus: 2021]	2022	983	My Applicatior
ME21	Master of Education Degree (MEd) [Syllabus: 2021]	2021	704	My Applicatior
PM20PT	Postgraduate Diploma in Education Management (PgDEM) (Part Time) [Syllabus: 2017]	2020	0	My Applicatior

❶ Total Applications Recieved

User Counter

Δ329 | Σ4725

Facebook
RSS Feeds
Contact Us

Signup as a User
IDs and Codes Standards
User ID and Password Recovery
Paying with LankaQR Apps

Signup as a Coordinator
IDs and Codes Standards

Signup as a Exam
IDs and Codes Sta

Site Map Contact Us Terms of Use Privacy & Cookies Email Login © 2019 - 2021 Nat

https://www.exams.nie.lk/intakes/new

1/1

25

ExSys

User ID

Forgot your User ID or Password

« Home | Sign Up Now



Please login..

Using your User ID and Password..

User ID: User ID

Password: Password

Login | Reset

Sign Up as a User..

If you do not have an account; Please Sign-Up as a user and update user Profile (Other Details) first..!

Sign Up Now

User Counter

Δ329 | Σ4726

Facebook
RSS Feeds
Contact Us

Signup as a User
IDs and Codes Standards
User ID and Password Recovery
Paying with LankaQR Apps

Signup as a Coordinator
IDs and Codes Standards

Signup as a Exam
IDs and Codes Sta

	චෙක්පත් අංකය	නිකුත් කල දිනය	වටිනාකම රු.	වර්තමාන තත්ත්වය
1	005149	2020.07.16	675.00	2021/07/06 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
2	005154	2020.07.16	200.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
3	005240	2020.07.20	750.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
4	005319	2020.07.20	700.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
5	005407	2020.07.20	2,700.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
6	005490	2020.07.21	7,800.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
7	005613	2020.07.21	2,700.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
8	005680	2020.08.04	1,500.00	2021/02/17 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
9	005690	2020.08.04	700.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
10	005691	2020.08.04	1,500.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
11	005729	2020.08.04	1,500.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
12	005736	2020.08.04	1,500.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
13	005743	2020.08.04	750.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
14	005754	2020.08.04	750.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
15	005763	2020.08.04	1,500.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
16	005774	2020.08.04	1,500.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
17	005789	2020.08.04	1,400.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
18	005853	2020.08.05	4,200.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
19	005856	2020.08.05	750.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
20	006023	2020.08.10	644.00	2021/02/24 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
21	006032	2020.08.10	644.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
22	007071	2020.07.08	16,200.00	චෙක්පත අස්ථාන ගත වී ඇති බැවින් එහි ගෙවීම අවලංගු කර 121220 චෙක්පත මඟින් නැවත ගෙවා ඇත. නව චෙක්පත 2021/07/14 දින නිෂ්කාශනය වී ඇත.
23	007080	2020.07.08	2,100.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
24	007115	2020.07.10	7,800.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
25	007117	2020.07.10	7,800.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
26	630987	2020.10.05	3,000.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
27	630989	2020.10.05	3,000.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
28	529007	2020.07.28	7,800.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
29	529041	2020.08.13	7,800.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
30	529108	2020.08.27	3,600.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
31	529115	2020.08.27	4,500.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
32	529123	2020.08.27	3,900.00	2021/08/09 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
33	529130	2020.08.27	3,900.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
34	529140	2020.08.27	10,800.00	රු4,500ක් වූ මෙම චෙක්පත 2020/10/05 දින නිෂ්කාශනය වී ඇත
35	529183	2020.09.08	2,430.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
36	529222	2020.09.17	5,400.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
37	681621	2020.10.24	4,480.00	2021/02/12 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
38	681650	2020.11.02	71,625.00	2021/08/02 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
39	009181	2020.08.17	2,000.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
40	009187	2020.08.17	14,400.00	චෙක්පත නොලද බැවින් ආදායකයාගේ ඉල්ලීම මත චෙක්පත අවලංගු කර 121159 චෙක්පත මඟින් නැවත ගෙවා ඇත. නව චෙක්පත 2021/06/09 දින නිෂ්කාශනය වී ඇත.
41	009194	2020.08.17	1,904.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
42	009863	2020.09.21	750.00	රු1,500ක් වූ මෙම චෙක්පත 2020/12/11 දින නිෂ්කාශනය වී ඇත
43	009424	2020.09.21	700.00	2021/07/22 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
44	009439	2020.09.21	2,100.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
45	009488	2020.09.22	1,050.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
46	009490	2020.09.22	1,500.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
47	009504	2020.09.23	750.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58

48	009513	2020.09.23	1,400.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
49	009514	2020.09.23	1,400.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
50	009538	2020.09.23	700.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
51	009550	2020.09.23	1,500.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
52	009553	2020.09.23	9,000.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
53	009560	2020.09.23	3,900.00	2021/05/19 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
54	009563	2020.09.23	4,200.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
55	009565	2020.09.23	2,700.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
56	009566	2020.09.23	1,500.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
57	009568	2020.09.23	2,700.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
58	009569	2020.09.23	1,500.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
59	009571	2020.09.23	2,700.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
60	009573	2020.09.23	750.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
61	009575	2020.09.23	1,400.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
62	009579	2020.09.23	2,700.00	2021/02/11 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
63	009588	2020.09.23	1,500.00	2021/02/01 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
64	009619	2020.09.24	1,500.00	2021/02/12 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
65	009643	2020.09.23	1,500.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
66	009646	2020.09.23	1,500.00	2021/02/12 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
67	009657	2020.09.24	750.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
68	009674	2020.09.24	6,000.00	2021/02/08 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
69	009676	2020.09.24	1,500.00	2021/03/05 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
70	009677	2020.09.24	2,100.00	2021/03/09 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
71	009678	2020.09.24	1,500.00	2021/03/05 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
72	009694	2020.09.24	2,700.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
73	009813	2020.10.06	205,500.00	2021/03/05 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
74	009813	2020.10.06	205,500.00	2021/03/05 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
75	009838	2020.10.09	1,500.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
76	009855	2020.10.09	6,000.00	2021/02/05 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
77	009862	2020.10.09	700.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
78	009877	2020.10.12	2,700.00	2021/02/11 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
79	009954	2020.10.13	3,493.50	2021/02/10 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
80	009955	2020.10.13	2,400.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
81	010043	2020.10.21	15,000.00	2021/02/10 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
82	379756	2020.09.30	21,600.00	2021/02/16 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
83	379757	2020.09.30	10,800.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
84	379764	2020.09.30	5,400.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
85	379801	2020.09.30	7,800.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
86	379801	2020.09.30	7,800.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
87	379810	2020.09.30	10,800.00	චෙක්පත අවලංගු කර 622520 චෙක්පත මඟින් නැවත ගෙවා ඇත. නව චෙක්පත 2021/07/12 දින නිෂ්කාශනය වී ඇත.
88	379821	2020.10.02	2,700.00	2021/02/17 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
89	379822	2020.10.02	10,800.00	2021/01/12 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
90	379830	2020.10.06	2,700.00	චෙක්පත් අංකය 379836 ලෙස නිවැරදි විය යුතුය. 2020/12/01 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
91	379864	2020.10.06	1,500.00	2021/02/08 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
92	379926	2020.10.16	1,500.00	2021/02/03 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
93	379931	2020.10.16	5,400.00	2021/02/10 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
94	379933	2020.10.16	2,700.00	2021/02/12 දින චෙක්පත නිෂ්කාශනය වී ඇත.
95	528854	2020.06.10	5,400.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
96	509935	2020.03.20	26,829.00	චෙක්පත අවලංගු කර 376909 චෙක්පත මඟින් නැවත ගෙවා ඇත. නව චෙක්පත 2021/09/15 දින නිෂ්කාශනය වී ඇත.
97	509944	2020.03.20	560.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
98	510101	2020.06.15	4,703.00	චෙක්පත අවලංගු කර ආදායමට ගෙන ඇත. ජ'නල් අංක 58
			856,037.50	

#	චෙක්පත් අංකය	නිකුත් කල දිනය	වටිනාකම රු.	2020.12.31 දිනට ගතවූ කාලය
1	5154	16-Jul-2020	200.00	මාස 5 දින 15
2	5729	4-Aug-2020	1,500.00	මාස 4 දින 27
3	5736	4-Aug-2020	1,500.00	මාස 4 දින 27
4	5743	4-Aug-2020	750.00	මාස 4 දින 27
5	5754	4-Aug-2020	750.00	මාස 4 දින 27
6	5763	4-Aug-2020	1,500.00	මාස 4 දින 27
7	5774	4-Aug-2020	1,500.00	මාස 4 දින 27
8	5789	4-Aug-2020	1,400.00	මාස 4 දින 27
9	5856	5-Aug-2020	750.00	මාස 4 දින 26
10	6032	10-Aug-2020	644.00	මාස 4 දින 21
11	7080	8-Jul-2020	2,100.00	මාස 5 දින 23
12	630987	5-Oct-2020	3,000.00	මාස 2 දින 26
13	630989	5-Oct-2020	3,000.00	මාස 2 දින 26
14	529007	28-Jul-2020	7,800.00	මාස 5 දින 3
15	529115	27-Aug-2020	4,500.00	මාස 4 දින 4
16	529222	17-Sep-2020	5,400.00	මාස 3 දින 14
17	681650	2-Nov-2020	71,625.00	මාස 1 දින 29
18	9439	21-Sep-2020	2,100.00	මාස 3 දින 10
19	9513	23-Sep-2020	1,400.00	මාස 3 දින 8
20	9560	23-Sep-2020	3,900.00	මාස 3 දින 8
21	9568	23-Sep-2020	2,700.00	මාස 3 දින 8
22	9569	23-Sep-2020	1,500.00	මාස 3 දින 8
23	9571	23-Sep-2020	2,700.00	මාස 3 දින 8
24	9573	23-Sep-2020	750.00	මාස 3 දින 8
25	9575	23-Sep-2020	1,400.00	මාස 3 දින 8
26	9643	23-Sep-2020	1,500.00	මාස 3 දින 8
27	9657	24-Sep-2020	750.00	මාස 3 දින 7
28	9676	24-Sep-2020	1,500.00	මාස 3 දින 7
29	9694	24-Sep-2020	2,700.00	මාස 3 දින 7
30	9813	6-Oct-2020	205,500.00	මාස 2 දින 25
31	9838	9-Oct-2020	1,500.00	මාස 2 දින 22
32	9862	9-Oct-2020	700.00	මාස 2 දින 22
33	9877	12-Oct-2020	2,700.00	මාස 2 දින 19
34	9954	13-Oct-2020	3,493.50	මාස 2 දින 18
35	9955	13-Oct-2020	2,400.00	මාස 2 දින 18
36	379757	30-Sep-2020	10,800.00	මාස 3 දින 1
37	379764	30-Sep-2020	5,400.00	මාස 3 දින 1
38	379801	30-Sep-2020	7,800.00	මාස 3 දින 1
39	379801	30-Sep-2020	7,800.00	මාස 3 දින 1
40	528854	10-Jun-2020	5,400.00	මාස 6 දින 21
41	509935	20-Mar-2020	26,829.00	මාස 9 දින 11
42	509944	20-Mar-2020	560.00	මාස 9 දින 11
43	510101	15-Jun-2020	4,703.00	මාස 6 දින 16
එකතුව			416,404.50	

කම්කරු දෙපාර්තමේන්තුව
தொழில் திணைக்களம்
DEPARTMENT OF LABOUR
මහරගම දිස්ත්‍රික් කම්කරු කාර්යාලය
மஹரகம மாவட்டத் தொழில் அலுவலகம்
Maharagama District Labour Office

මගේ අංකය எனது இலக்கம் My Number	18344/B	මගෙ අංකය உமது இலக்கம் Your Number		දිනය திகதி Date	2022.10.25

ලි.ප.කැ.

ජාතික අධ්‍යාපන ආයතනය,
තැ.පෙ.21,
පිලෙවල් පාර,
මහරගම.

ප්‍රමාදවී ගෙවන දායක මුදල් සඳහා අය කරන දඩ මුදලින් නිදහස් කිරීම.
ජාතික අධ්‍යාපන ආයතනය - 18334/B

උක්ත කරුණ සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් (සේ.අ.අ.) විසින් ඔබටද පිටපතක් සහිතව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමුකරන ලද 2022.07.18 දිනැති ලිපිය හා බැඳේ.

02) අංක 18011482 හා 2019.06.21 දිනැති නිවේදනය මඟින් 2006/01- 2015/02 කාලසීමාවට අදාලව පහත සඳහන් පරිදි ඔබ සේ.අ.අ. ගණනය කර ඇත.

දායක මුදල	:	රු.16,154,508.30
අධිභාරය	:	රු.23,077,253.91
මුළු මුදල	:	රු.69,231,762.27
දැනට ගෙවාඇති මුදල		
නඩු මඟින්	:	රු. 473,895.00
වාරික වශයෙන්	:	රු. 26,841,885.18
ගෙවීමට ඇති මුදල	:	රු.41,915,982.03

03) නමුත් ඔබ ආයතනය රාජ්‍ය ආයතනයක් වන බැවින් හා එම හිඟ දායක මුදල් ජීවන වියදම් දීමනාව සඳහා ගණනය කර ඇති හෙයින් ඉහත සඳහන් රු.23,077,253.91 ක් වූ අධිභාර මුදල් සම්පූර්ණයෙන්ම නිදහස් කිරීමට කම්කරු කොමසාරිස් ජනරාල් විසින් අනුමත කර ඇත.

ඇමුණුම 04

04) ඒ අනුව අංක 18011482 දරණ නිවේදනය සඳහා ගෙවිය යුතු හිඟ දායක මුදල වන රු.18,838,728.12 ක මුදල 2022.11.15 දිනට පෙර ගෙවන ලෙසත් එසේ හිඟ මුදල ගෙවීමට අපොහොසත් වුවහොත් නැවත දැනුම් දීමකින් තොරව නීතිමය පියවර ගන්නා බවත් කව දුරටත් දන්වා සිටිමි.

2022.09.05 දිනැති නිවේදනය මෙයින් අවලංගු කෙරේ.

සහකාර කම්කරු කොමසාරිස්,
මහරගම.

ආර්.ජී.ජේ.බී.ගුණතිලක
සහකාර කම්කරු කොමසාරිස්
දිස්ත්‍රික් කර්මකරු කාර්යාලය
මහරගම

ගුරු ගෙදර වැඩසටහන

COVID -19 තත්ත්වය හමුවේ පාසල් අධ්‍යාපනයේ ඇති වූ බාධාවන් මඟහරවා ගැනීම වෙනුවෙන් ක්‍රියාත්මක කළ ගුරු ගෙදර වැඩසටහන වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය හා වෙනත් සංවිධාන විසින් රු. 155,106,221/- ක මුදලක් ලබා දී ඇති බව විගණන වාර්තාවේ සඳහන් වීම පිළිගත නොහැක.

ජාතික අධ්‍යාපන ආයතනයට එහි සාමාන්‍ය කාර්යභාරයන් ඉටු කිරීම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් හා වෙනත් ආයතන වෙතින් 2020 වර්ෂයේ ලද සමස්ත මුදල රු. 155,106,220/75 ක් වේ. එය පහත පරිදි වේ.

	රු.
GEMP	130,000,000/-
UNICEF	5,885,000/-
KOREAN/ CANADA	6,403,220/75
Local MOE	12,818,000/-
	155,106,220/75

